*සැ. යු.*– 2007.11.09 දින පළවූ අංක 1,523 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,524 - 2007 නොවැම්බර් 16 වැනි සිකුරාදා - 2007.11.16

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1062 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |

| | පිටුව |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... .. | 1063 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | 1063 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 1071 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සැහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 නොවැම්බර් මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 නොවැම්බර් මස 09 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

DIRF/RECT/88 (VII) AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම

පහත නම සඳහන් කෙඩෙට් නිලධාරීන් 2006 ජනවාරි මස 11 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවෙනි ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙන සේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු සේවා බලකාය වෙත ඇතුලත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පල කරනු ලැබ තිබේ.

සී/56188 කෙඩෙට් නිලධාරි ඒකනායකගේ ඉමාල් චතුරංග
සී/56192 කෙඩෙට් නිලධාරි තලවතුරේ ගෙදර දුමින්ද නලීන් සුරවීර

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

11-462

---

D/22/NY/402

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරිනිය 2007 නොවැම්බර් මස 09 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගන්වා ඇත.

කොමාණ්ඩර් (සැ) ස්ටෙලා ශ්‍රියානි සහබන්දු, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 0415

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

11-464/1

---

D/22/NY/402.

## ශ්‍රී ලංකා නාවික හමුදාව

### නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරිනිය 2007 නොවැම්බර් මස 09 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කොමාණ්ඩර් (සැ) ස්ටෙලා ශ්‍රියානි සහබන්දු, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 0415

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

11-464/2

---

2007 අංක 458

ඩී/ආර්එෆ්/832/එන්වයි.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

### මරණයෙන් පසු උසස් කිරීම

පහත නම් සඳහන් නිලධාරියා 2007 අප්‍රේල් මස 28 දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් මරණයෙන් පසුව උසස් කිරීම අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් (නාසෙ) පොද්දිවෙල කංකානන්ගේ බන්දුල, එන්ආර්පී 1239 ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 24 වැනි දින,
කොළඹ දී ය.

11-463

# ආණ්ඩුවේ නිවේදන

## දේශීය ආදායම් පනත යටතේ දේශීය ආදායම් සමාලෝචන මණ්ඩලයට පත් කිරීම

1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 118(1) වගන්තිය 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 137 (1) වගන්තිය හා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 166(1) වගන්තිය යටතේ ගරු මුදල් අමාත්‍යතුමා විසින් 2007.10.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි තුන් අවුරුදු කාල පරිච්ඡේදයකට පහත නම් සඳහන් අයගේ සමාලෝචන මණ්ඩලයේ සාමාජිකත්වය දීර්ඝ කරන ලදී.

1. ඩී. කලංසූරිය මයා
2. අයි. කේ. වීරවර්ධන මයා
3. සී. ජී. පෙරේරා මයා
4. ඩබ්. නානායක්කාර මිය
5. ඕ. ඩබ්. ඕ. බී. වීරසේන මයා
6. ඩබ්. එච්. ඒ. රණසිංහ මයා

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 16 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01.

11-487

## සමිති ආඥා පනත

සමිති ආඥා පනතේ (123 අධිකාරය) 3 වන සහ 4 වන වගන්ති වලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර සහ පාරිභෝගික සේවා අමාත්‍ය සුමිත්‍ර ආරච්චිගේ දොන් බන්දුල චන්ද්‍රසිරි ගුණවර්ධන වන මම මෙම නිවේදනයෙන්,

01. ගම්පහ, බණ්ඩාරනායක විද්‍යාලය දරන ස්ථානයේ පිහිටි "ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය" නැමැති සමිතිය, සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් වශයෙන් නියම කරමි.

02. සමිති ආඥා පනතේ 5(4) වගන්තියේ විධිවිධාන වලින් නිදහස් කිරීමෙන් ඒ ආඥා පනතේ අදාළ කිරීම් එකී සමිතියට සීමා කරමි.

සුමිත්‍ර ආරච්චිගේ දොන් බන්දුල චන්ද්‍රසිරි ගුණවර්ධන,
වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර සහ
පාරිභෝගික සේවා අමාත්‍ය.

2007 ඔක්තෝබර් මස 31 වැනි දින,
වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර සහ
පාරිභෝගික සේවා අමාත්‍යාංශය,
අංක 330, යූනියන් පෙදෙස,
කොළඹ 02.

11-619

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## යාපනය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

### 2004 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

(වියදම් ස්වභාවය අනුව වියදම් වර්ගීකරණය විස්තර කර ඇත.)

| **ක්‍රියාකාරී ආදායම** | *2004 දෙසැ. 31න් අවසන් වූ වර්ෂය රු.* | *2003 දෙසැ. 31න් අවසන් වූ වර්ෂය රු.* |
|---|---|---|
| පුනරාවර්තන ප්‍රදාන | 288,000,000.00 | 266,104,000.00 |
| වෙනත් කාර්යවලින් ශුද්ධ ආදායම/(පාඩුව) | 3,443,351.76 | 4,024,458.05 |
| වෙනත් ආදායම් | 7,422,283.50 | 6,236,304.63 |
| | 298,865,635.26 | 276,364,762.68 |
| ශිෂ්‍යයන්ට මූල්‍ය ආධාර | 71,372,850.00 | 59,671,290.00 |
| | 370,238,485.26 | 336,036,052.68 |
| **ක්‍රියාකාරී වියදම්** | | |
| පෞද්ගලික පඩිනඩි | 246,509,726.06 | 239,185,165.82 |
| ගමන් වියදම් | 2,228,012.54 | 2,672,590.70 |
| සැපයුම් සහ භාවිත කළ පරිභෝජන | 20,743,830.84 | 11,250,977.50 |
| නඩත්තුව | 4,892,665.83 | 3,549,478.03 |
| කොන්ත්‍රාත් සේවා | 17,633,272.92 | 13,646,566.57 |
| පර්යේෂණ හා සංවර්ධන | 592,967.17 | 274,489.15 |
| ක්ෂය හා ක්ෂය වැය | 72,784,587.05 | 63,098,941.78 |
| වෙනත් ක්‍රියාකාරී වියදම් | 7,244,833.85 | 7,380,101.61 |

| ක්‍රියාකාරී වියදම | *2004 දෙසැ. 31න් අවසන් වූ වර්ෂය රු.* | *2003 දෙසැ. 31න් අවසන් වූ වර්ෂය රු.* |
|---|---|---|
| මුළු ක්‍රියාකාරී වියදම් | 372,689,896.26 | 341,058,311.16 |
| ක්‍රියාකාරී කටයුතුවලින් අතිරික්තය/(ඌනතාව) | (2,451,411.00) | (5,022,258.48) |
| ශිෂ්‍යයන්ට මූල්‍ය ආධාර | 71,372,850.00 | 59,671,290.00 |
| මුළු කටයුතුවලින් අතිරික්තය/(ඌනතාව) | (73,824,261.00) | (64,693,548.48) |
| සුවිශේෂ භාණ්ඩ | 901,132.28 | 379,061.67 |
| (කපා හැරීම සහ ගැලපීම්) | | |
| අදාළ කාලයේ ශුද්ධ අතිරික්තය/(ඌනතාව) | (74,725,393.28) | (65,072,610.15) |
| පොදු සංචිතයට මාරු කළා | | |

නිවැරදි බවට සහතික කරන ලදී.

2005 පෙබරවාරි මස 18 වැනි දින,

මහාචාර්ය එස්. මෝහන්දාස්
ගණක නිලධාරි,
උපකුලපති.

කේ. කනගරත්නම්
මූල්‍යාධිකාරී.

## යාපනය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

## 2004 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | *2004 දෙසැ. 31 දිනට* | | *2003 දෙසැ. 31 දිනට* | |
|---|---|---|---|---|
| | *රු.* | *රු.* | *රු.* | *රු.* |
| වත්කම් | | | | |
| ප්‍රවර්තන නොවන වත්කම් | | | | |
| දේපළ, පිරියත් සහ උපකරණ | 252,173,702.33 | | 167,223,142.67 | |
| ආයෝජන (L. T.) | 58,725,841.76 | | 51,216,057.83 | |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | 211,748,796.53 | 522,648,340.62 | 211,748,796.53 | 430,187,997.03 |
| ප්‍රවර්තන වත්කම් | | | | |
| ඉන්වෙන්ටරි/තොග | 6,471,798.39 | | 12,635,531.33 | |
| වෙළඳ හා ලැබිය යුතු වෙනත් මුදල් | 391,199,920.49 | | 322,195,987.58 | |
| ආයෝජන (ST) | 3,818,488.45 | | 2,050,122.32 | |
| මුදල් හා මුදල් සමාන දේ | 26,678,163.64 | 428,168,370.97 | 16,977,833.95 | 353,859,475.18 |
| මුළු වත්කම් | | 950,816,711.59 | | 784,047,472.21 |
| බැරකම් | | | | |
| ප්‍රවර්තන බැරකම් | | | | |
| ගෙවිය යුතු මුදල් | 22,750,367.62 | | 30,092,730.07 | |
| උපචිත වියදම් | 2,468,077.29 | | 3,930,040.85 | |
| ස්වයං මූල්‍ය පාඨමාලා | 11,520,795.02 | 36,739,239.93 | 9,076,871.40 | 43,099,642.32 |
| ප්‍රවර්තනය නොවන බැරකම් | | | | |
| ගෙවිය යුතු මුදල් | 3,027,969.09 | | 3,048,173.74 | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 83,387,838.71 | | 75,217,518.46 | |
| සීමිත අරමුදල | 77,268,623.82 | 163,684,431.62 | 66,674,776.13 | 144,940,468.33 |
| මුළු බැරකම් | | 200,423,671.55 | | 188,040,110.65 |
| මුළු ශුද්ධ වත්කම් | | 750,393,040.04 | | 596,007,361.56 |
| ශුද්ධ වත්කම්/ස්කන්ධය | | | | |
| සමුච්චිත අරමුදල (මූල ධන ප්‍රදාන) | 1,237,954,256.40 | | 1,015,624,740.07 | |
| සංචිතය | | | | |

| | 2004 දෙසැ. 31 දිනට | | 2003 දෙසැ. 31 දිනට | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| පොදු සංචිතය | (580,557,543.63) | | (509,888,798.92) | |
| බැඳුම්කර බැඳීම් සංචිතය | 92,938,467.27 | | 90,213,560.41 | |
| ප්‍රාග්ධන | 57,860.00 | 750,393,040.04 | 57,860.00 | 596,007,361.56 |
| මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය | | 750,393,040.04 | | 596,007,361.56 |
| මුළු බැරකම් | | 200,423,671.55 | | 188,040,110.65 |
| මුළු බැරකම් සහ ස්කන්ධ (යෙද වූ මුළු මුදල) | | 950,816,711.59 | | 784,047,472.21 |

නිවැරදි බවට සහතික කරමි.

මහාචාර්ය එස්. මෝහන්දාස්,
ගණක නිලධාරි,
උපකුලපති.
2005.02.18

කේ. කනගරත්නම්
මූල්‍යාධිකාරි.

## යාපනය විශ්වවිද්‍යාලයේ 2004 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යාපනය විශ්වවිද්‍යාලයේ 2004 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උපවගන්ති සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) සහ 111 වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කෙරේ. මුදල් පනතේ 13(7) ඒ වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2005 මාර්තු මස 29 දින විශ්ව විද්‍යාලයේ උපකුලපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 *විගණන විෂය පථය*

මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනිකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශයන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගණකාධිකරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශ වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම සහ යොදාගන්නා ලද ගණකාධිකරණ ප්‍රතිපත්ති සුදුසු ද, ඒවා ඒකාකාරීව අනුගමනය කරන ලද්දේද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණනයට ඇතුළත් විය. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. *ගිණුම්*

2.1 *විගණන මතය*:- මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මාගේ උපරිම තොරතුරු සහ මට සපයන ලද පැහැදිලි කිරීම් අනුව මාගේ වාර්තාවේ 2 2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ මූල්‍ය ප්‍රකාශයන්හි දී ඇති සටහන් වල (අංක 2) දක්වා ඇති පරිදි වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කොට ඉදිරිපත් කර ඇති බවත් එමගින් 2004 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල වල සහ මුදල් ප්‍රවාහයෙහි සත්‍ය හා සාධාරණ ස්වරූපයක් පෙන්නුම් කෙරෙන බවත්ය.

2.2 *ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම්*

2.2.1 *ගිණුම්කරණ ප්‍රතිපත්ති*

පහත සඳහන් නිරීක්ෂණයක් කරනු ලැබේ :

(අ) රු. 64,614,267 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය ගණන් බැලීමේදී වත්කම් මිලදී ගැනීමේ දිනය හෝ පාවිච්චි කළ දිනය පිළිබඳ සැලකිල්ලට නොගෙන වත්කම් වල පිරිවැය පොදු ලෙජරයේ සටහන් කළ දිනය පදනම් කරගෙන තිබුණි.

(ආ) රු. 6,471,798 ක් වූ ගබඩා අත්තිකාරම් ගිණුමේ ශේෂය පොදු ගබඩාවේ තොග ලෙස ගිණුම්වල පෙන්වා තිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් භෞතිකව පරීක්ෂා කරන ලද අගය අනුව නොව පොත් අගය අනුව ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

2.2.2 *ගිණුම් තැබීමේ අඩුපාඩු* :- විදයම රු. 2,022,003 කට අදාළ ගනුදෙනු නියැදියක් පදනම් කරගෙන කරන ලද විගණන සෝදිසි පරීක්ෂණයකදී නිරීක්ෂණය වූ ගණකාධිකරණ අඩුපාඩු නවයක් විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. එබැවින් තවදුරටත් ගණකාධිකරණ අඩුපාඩු තිබීමේ හැකියාව බැහැර කළ නොහැක.

2.2.3 *ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 1,486,898 ක් වූ විශ්වවිද්‍යාලයට ලැබිය යුතු මුදල් අදාල පාර්ශවයන් විසින් තහවුරු කර නොතිබුණි.
(ආ) එකතුව රු. 282,082,541 ක් වූ ණයගැතියන් සම්බන්ධයෙන් වයස් විශ්ලේෂණයක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ) එකතුව පිළිවෙලින් රු. 307,023,572 ක් සහ රු. 10,018,018 ක් වූ ණය ගැතියන් සහ ණය හිමියන්ගෙන් ශේෂ තහවුරු කිරීම් කැඳවා නොතිබුණි.

2.2.4 *විගණනය සඳහා සාක්ෂි නොමැති වීම*

රු. 993,582,353 ක් වූ වත්කම්ද, එකතුව රු. 36,610,693 ක් වූ වියදම් ද අවශ්‍ය සාක්ෂි නොමැති වීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

2.2.5 *නීති රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්*

පහත සඳහන් නීති, භාණ්ඩාගාර චක්‍රලේඛ සහ රජයේ මුදල් රෙගුලාසි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම සහ උසස් අධ්‍යාපන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහය ආදියෙහි සමහර ප්‍රතිපාදනයන්ට අනුකූල නොවීම් තිබුණු අතර ඒ පිළිබඳව විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත නිකුත් කරන ලද මාගේ සවිස්තරාත්මක වාර්තාවේ පෙන්වා දෙන ලදී.

(අ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත
(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය

v පරිච්ඡේදයේ 7 : 6 සිට 7: 6 :2 වගන්ති
xx පරිච්ඡේදයේ 3 : 1 වගන්තිය
xxv පරිච්ඡේදයේ 2 : 2 (එෆ්) වගන්තිය
xxvii පරිච්ඡේදයේ 9 : 4 වගන්තිය
xxiv පරිච්ඡේදයේ 3 : 1 වගන්තිය
xvii පරිච්ඡේදයේ 9 : 1
iii පරිච්ඡේදයේ 3 වගන්තිය
xx පරිච්ඡේදයේ 8 : 1 වගන්තිය

(ඇ) *විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛ*
1980 පෙබරවාරි අංක 63 හා 1997 නොවැම්බර් 21 අංක 721
(ඈ) *භාණ්ඩාගාර චක්‍රලේඛ*
1979 ජූලි 29 අංක 828
(ඉ) *මුදල් රෙගුලාසි*
අංක 264(1) 257, 570, 571, 700(5), 757,1250

3.1 *මූල්‍ය ප්‍රතිඵලය* - ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව 2004 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු. 362,725,394 ක ඌණතාවයක් වූ අතර පෙර වර්ෂය සඳහා අනුරූපී ඌණතාය රු. 331,176,610 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 288,000,000 ක ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා ඌණතාවය රු. 74,725,394 දක් අඩු වී තිබුණු අතර පෙර වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 266,104,000 ක දායකය නිසා එම වර්ෂයේ පාඩුව රු. 65,072,610 දක්වා අඩු වී තිබුණි.

3.1.1 *විශේෂිත අරමුදල් ක්‍රියාත්මක කිරීම*- විශේෂිත අරමුණු සඳහා ලැබුණු ප්‍රදානයන් සහ එහි පොලිය එකතුව රු. 28,951,068 ක් ඒවා ප්‍රදානය කරන ලද අරමුණු සඳහා පාවිච්චි කර නොතිබුණි.

3.1.2 *සීඩා/සරෙක් ව්‍යාපෘතියේ අරමුදල් පාවිච්චිය*

සීඩා/සරෙක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. ඉහත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගිවිසුමේ පිටපතක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබූ අතර ව්‍යාපෘති කාර්ය සාධන වාර්තාවද ඉදිරිපත් කර නොතිබුණි.

ii. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පොත්පත් හා වාර්තා නිසි පරිදි නඩත්තු කර නොතිබුණි.

iii. විශ්වවිද්‍යාල පනතේ 99(2) වගන්තියට අනුව විශ්වවිද්‍යාල අරමුදලට ලැබෙන සියළු ලැබීම් මාසිකව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දැනුම් දීම අවශ්‍ය විය. කෙසේ වුවද ඉහත දක්වන ලද අරමුදලට ලැබීම් සම්බන්ධයෙන් මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි.

3.1.3 *පර්යේෂණ ප්‍රදාන භාවිතය*

පර්යේෂණ ප්‍රදාන පාවිච්චි කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය කරනු ලැබූ විගණන සෝදිසි පරීක්ෂාවකදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් එක් පර්යේෂණ ව්‍යාපෘතියට අදාල ලිපිගොනු නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. මෙම ලිපිගොනුවල ව්‍යාපෘතියට අදාල ගිවිසුම්, ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා ඉල්ලීම සහ අනුමැතිය, ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ මූල්‍ය සහ වාර්ෂික වාර්තා සහ විශේෂඥයින්ගේ සහය ලබා ගැනීම් සම්බන්ධ විස්තර ඇතුලත්ව නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති සඳහා ලද අරමුදල් සම්බන්ධිත අරමුණු ඉටු කර ගැනීම සඳහා පාවිච්චි කර තිබුනේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි වූ අතර ව්‍යාපෘති කාර්ය සාධනය සම්බන්ධයෙන් විධිමත් ඇගයීමක් කිරීමට නොහැකි විය.

(ආ) පර්යේෂණ වැඩ සම්පූර්ණ වීම මත සමහර පර්යේෂකයින් විසින් ඉදිරිපත් කර තිබූ වාර්තා ඉතා දුර්වල වූ අතර පර්යේෂණ සඳහා ගෙවීම් ලබා ගැනීමට ඉදිරිපත් කර තිබූ උපාය මාර්ගයන්ට ඒවා පටහැනි වන අතර ක්ෂේත්‍ර කටයුතු වල යථා පරිදි නිරත නොවී අනෙකුත් මූලයන්ගෙන් ලබා ගත් දත්ත සහ තොරතුරු පදනම් කරගෙන අවසන් වාර්තාව සකස් කර තිබුණු අවස්ථා ඇගයීම් නිලධාරීන් විසින් වාර්තා කර තිබුණි. නමුත් ඵලදායී නොවන පර්යේෂණ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

3.1.4 *හඳුනානොගත් පාඩු :*

(අ) වරායේ දී නැති වූ රු. 314,264 ක් වටිනා රසායන ද්‍රව්‍ය, වීදුරු භාණ්ඩ සහ රු. 233,925 ක් වටිනා රසායනාගාර උපකරණ වටිනාකම ගිණුම් වලින් කපාහැර තිබුණි.

(ආ) කලබලකාරී තත්ත්වයක් නිසා නැති වූ වටිනාකම රු. 49,324 ක් වූ උපකරණ සහ වටිනාකම රු. 104,200 ක් වූ පශු සම්පත් වල වටිනාකම් ගිණුම් වලින් කපා හැර තිබුණි.

3.1.5 *ව්‍යාපෘති ප්‍රමාදයන් :*

(අ) 1987 පමණ තරම් වූ කාලයක සිට ගිවිසුම් වලට එළඹ තිබූ විවිධ ව්‍යාපෘති යටතේ වූ කොන්ත්‍රාත් වැඩ සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) 1990 වර්ෂයේ ආරම්භ කරන ලද 2004 වර්ෂය වන විටත් අවසන් කර නොතිබුණු වෛද්‍ය පීඨයේ ශ්‍රවනාගාරය ඉදිකිරීම් සඳහා 2004 දෙසැම්බර් දක්වා රු. 20,123,986 ක් කොන්ත්‍රාත් සමාගමකට ගෙවා තිබුණ අතර ඉදිකිරීමේ පිරිවැය ඉතා අධික ලෙස වැඩි වී තිබුණු අතර මෙම ශ්‍රවනාගාරය ඉදිකිරීමේ පරමාර්ථයද ඉටු වී නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි නඩත්තු කටයුතු සඳහා සෘජුවම සම්බන්ධ වූ සේවකයන්ගේ වැටුප් හා දීමනා වලට අමතරව අලුත්වැඩියාවන් වෙනුවෙන් රු. 3,322,417 ක් ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා වියදම් කර තිබුණි. වර්ෂය අවසානය වන විට පාවිච්චි නොකරන ලද ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩාවල තිබුණු නමුත් ගොඩනැගිලි ද්‍රව්‍ය සහ වෙනත් සවි කිරීම් ශේෂයක් නොමැති බව දක්වමින් වාර්තාවක් ගොඩනැගිලි නඩත්තු කටයුතු භාර ඉංජිනේරුවරයා තවදුරටත් වාර්තා කර තිබුණි කෙසේ නමුත් විශ්වවිද්‍යාල ගොඩනැගිලි සතුටුදායක ලෙස නඩත්තු කර නොතිබුණු අතර සමහර පීඨයන් වාර්තා කර ඇති පරිදි සමහර නඩත්තු වැඩ සඳහා ද්‍රව්‍ය සහ සවිකිරීම් පාවිච්චි කර නොතිබුණි.

3.1.6 *අධ්‍යයන කාර්ය මණ්ඩලයට පත් කිරීම්*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) සාමාන්‍ය, රීතියක් හැටියට විශ්වවිද්‍යාලයේ එක් එක් හා සෑම පීඨයකටම වෙන් වෙන්ව ස්ථිර කථිකාචාර්ය තනතුරු සඳහා බඳවා ගෙන තිබුණු අතර එහි ප්‍රතිඵලක් ලෙස එකම අධ්‍යයන ක්ෂේත්‍රයේ කථිකාචාර්යවරු කිහිපදෙනෙක් බඳවාගෙන තිබුණි. විවිධ පීඨ සඳහා කාල සටහන් සකස් කිරීමේදී අනෙකුත් පීඨවල සිටින ස්ථිර කථිකාචාර්යවරුන් ගැන සලකා නොතිබුණි. වෙනත් පීඨයක් සඳහා ස්ථිර කථිකාචාර්යවරයෙකුගේ සේවය අවශ්‍ය විටකදී බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස වෙනම පත්වීමේ ලිපියක් නිකුත් කර එම සේවා සඳහා අතිරේක දේශන ගාස්තු ගෙවා තිබුණි.

(ආ) නිශ්චිත බඳවා ගැනීමේ පරිපාටියක් අනුගමනය නොකර කිහිප අවස්ථාවකදී තාවකාලික කථිකාචාර්යවරුන්, උපදේශකයන් (Tutors) සහ දේශක සහායකයින් වැනි අය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ ඉල්ලීම මත පත්කර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ක්‍රමය තුළ රැකියා බලාපොරොත්තු සුදුසුකම් සහිත අයට තරගකාරීව අවස්ථාව ලබානොදී අවිධිමත් පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම සිරිතක්ව පැවති අංගයක් වී තිබුණි. පෙර වර්ෂයේ ගිණුම් සම්බන්ධයෙන් වූ මාගේ වාර්තාවෙන්ද මේ සම්බන්ධයෙන් පෙන්වා දී තිබූ නමුත් මෙම අඩුපාඩුව නිවැරදි කිරීම සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) පළමු ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු හා III ශ්‍රේණියේ උපදේශකවරයෙකු වසර 13 සිට 18 ක කාලයක් සේවයට පැමිණ නොතිබුණු නමුත් විධිමත් අනුමැතියක් රහිතව ඔවුන් නැවත සේවයේ පිහිටුවා සේවයට නොපැමිණි කාලය විශේෂ වැටුප් රහිත නිවාඩු ලෙස සලකා තිබුණි.

3.1.7 *අධ්‍යයන කටයුතු* - විවිධ පීඨවල ශිෂ්‍යයන් 5,859 ක් වෙනුවෙන් දේශන පැවැත්වීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 399 දෙනෙකු සඳහා වැටුප් හා දීමනා ලෙස රු. 214,553,643 ක් ගෙවා තිබුණි. අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් භාරගෙන ඇති ක්‍රියාකාරකම් වල ආර්ථික, කාර්යක්ෂම සහ ඵලදායී බව ඇගයීමට හැකිවන පරිදි පහත සඳහන් තොරතුරු එනම්, එක් එක් පීඨය තුල සිටින සිසුන් සංඛ්‍යාව , එක් එක් පීඨයේ එක් එක් කථිකාචාර්යවරයා පවත්වන දේශන, දේශන/ක්‍රියාකාරකම් පැය ගණන පවත්වන ලද විභාග ගණන, සමත් වූ ශිෂ්‍යයන් ගණන ආදී වූ තොරතුරු විගණනය සඳහා ලබා දී නොතිබුණි.

3.1.8 *පාඨමාලා සහ විභාග :*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ පාඨමාලා 10කට ලියාපදිංචි වී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 5859 කි. සමාලෝචිත වර්ෂය සඳහා දරන ලද පුනරාවර්තන වියදම රු. 214,553,643 කි. එක් ශිෂ්‍යයෙකු සඳහා වර්ෂයේ සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය රු. 383, 284 ක් විය.

(ඇ) විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨ යටතේ පවත්වනු ලබන විවිධ පාඨමාලා වල විභාග පවත්වන දිනයන් හා විභාග වල ප්‍රතිඵල නිකුත් කරන ඉලක්ක දිනයන් තීරණයකර නොතිබුණි. 2003 සහ 2004 වර්ෂවල සමහර පීඨවල පවත්වනු ලැබූ විභාග වල ප්‍රතිඵල නිකුත් කිරීමට සැලෙන ප්‍රමාදයක් ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. 1995 ජූලි 14 දිනැති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 636 අනුව විභාගය අවසන් වී තුන් මසක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතුය. නමුත් මාස 06 සිට 12 දක්වා කාල පරාසයක් තුල ප්‍රතිඵල ප්‍රමාද වී තිබුණි.

3.1.9 පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා පඩි සහිත සහ පඩි රහිත නිවාඩු අනුමත කිරීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ 10 පරිච්ඡේදයේ 27.4 වගන්තියේ උපදෙස් සැලකිල්ලට නොගෙන අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වූ කථිකාචාර්යවරුන්ට එක් වසරකට වැඩි කාලයක් සඳහා අධ්‍යයන නිවාඩු අනුමත කර තිබුණි.

ii. එක් වර්ෂයක් සම්පූර්ණ කිරීමට පෙර ආධුනික කාලයේ සිටින කථිකාචාර්යවරුන්ට අධ්‍යයන නිවාඩු අනුමතකළ අවස්ථා තිබුණි.

3.1.10 අයවැය පාලනය :

අයවැය හා තත්‍ය අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බැව් පෙන්නුම් කෙරුණි.

4. පද්ධති හා පාලන.– විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඊ) වගන්තිය ප්‍රකාර මාගේ විස්තරාත්මක වාර්තාව මගින් විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ දැන ගැනීමට සලස්වන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) කාර්ය මණ්ඩල බඳවා ගැනීම්
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ණය ගැතියෝ
(ඈ) මිළදී ගැනීම්
(ඉ) ගබඩා
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය
(උ) අයවැය
(ඌ) අභ්‍යන්තර විගණනය

ඩබ්ලිව්. ඩී. හේමරත්න,
වැඩබලන විගණකාධිපති.

2004 දෙසැම්බර් මස 31 න් අවසන් වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව සම්බන්ධයෙන් යාපනය විශ්ව විද්‍යාලයේ පාලන බලධාරියාගේ නිරීක්ෂණ :

2.2.3 ලැබිය යුතු මුදල්වලින් බහුතරයට ඇතුළත් වන්නේ සේවක පිරිසට ගෙවන ලද ණය මුදල්වල/අත්තිකාරම්වල ශේෂයයි. ගෙවිය යුතු මුදල ඇතුලත් වන්නේ ශිෂ්‍ය තැන්පතු සහ කාර්ය මණ්ඩලයේ ඇප තැන්පතුය. එහෙයින් තහවුරු කිරීම් අනවශ්‍යය.

2.2.4 රු. 1,030,193,046 ක් වූ මුදල පිළිබඳ විස්තර විගණන නිලධාරීන් සපයා නොතිබීමේ හේතුවෙන් අපට මෙහිලා කිසිදු නිරීක්ෂණයක් නොකළ හැකිය. සියලුම ණය මුදල් සඳහා ආයු විශ්ලේෂණ දී තිබේ.

2.2.5 විශ්වවිද්‍යාලය හැකිතාක් දුරට විශ්වවිද්‍යාල පනතේත් ආයතන සංග්‍රහයේත් චක්‍රලේඛ ආශ්‍රයෙන් විධිවිධාන පිළිපදී.

3.1.1 අරමුදල තැන්පත් කර ඇත්තේ ස්ථාවර තැන්පතුවෙහිය. පරිත්‍යාගකරුගේ ඉල්ලීම අනුව පොලිය පමණක් භාවිතයට ගැනේ.

3.1.2 යාපනය විශ්ව විද්‍යාලය සහ සිඩා සරෙක් (SIDA SAREC) ව්‍යාපෘතිය අතර අත්සන් කරන ලද ගිවිසුම ලිපිගොනුවේ තිබේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙනුයේ යාපනය විශ්ව විද්‍යාලයේ පාලන සභාවේ අනුමැතිය ඇතිවය. මෙම ව්‍යාපෘතිය සඳහා වෙනම පොත් සහ වාර්තා පවත්වා ගෙන යනු ලැබේ.

ගිවිසුමට අනුව, භාණ්ඩාගාරයේ අනුමතිය ඇතිව "සිඩා සරෙක්" ව්‍යාපෘතිය සඳහා වෙනම බැංකු ගිණුමක් ක්‍රියාත්මක කෙරේ. එහෙයින් මෙම මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළේ නැත. එබැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දැනුම් දීමේ ප්‍රශ්නය පැන නගින්නේ නැත.

3.1.3 පිටස්තර මූලාශ්‍රවලින් අරමුදල් ලබන එක් එක් පර්යේෂණ ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන වෙනම ලිපිගොනු සහ වාර්තා පවත්වා ගෙන යනු ලැබේ. කෙසේ වුවද අරමුදල් ලබා දෙන අයගේ තෘප්තියට හේතු වන පරිදි පර්යේෂණ කටයුතු සමීක්ෂණය කිරීමට පියවර ගනු ලැබේ.

3.1.5 (*a*) මෙම ව්‍යාපෘති වැඩි ගණනක් නිම කර තිබෙන අතර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මුදා දී ඇති අත්තිකාරම් මුදල් පියවීමට පියවර ගනු ලැබේ.

(*b*) අපේ වාර්තාවලට අනුව රු. 20,123,986 ක මුදල ශ්‍රවනාගාරය පමණක් ඉදි කිරීම සඳහා කිසිදු ඉදි කිරීම් සමාගමට ගෙවා නැත. ශ්‍රවණාගාරය ඉදිකිරීමේ කටයුතු නිම කිරීම සඳහා අවශ්‍ය හැම පියවරක් ම ගනු ලැබේ.

(*c*) SRN M/167 සහ M/193 මත එකතු කර ගත් භාණ්ඩ පාවිච්චිය සඳහා දැනටමත් නිකුත් කර ඇත. එහෙත් විභාග ශාඛාව කොටස් දෙකකට බෙදා එක් කොටසක් වෙනත් තැනකට ගෙන ගොස් ඇති බැවින් එම භාණ්ඩ විභාග ශාඛාවේ ම තබා ඇත. තිබෙන සම්පත් ප්‍රයෝජනයට ගනිමින් පුද්ගලයන් සහ සම්පත් උපරිම වශයෙන් සහ කාර්යක්ෂම තත්ත්වයෙන් යොදා ගැනීමේ පිළිවෙත නඩත්තු ශාඛාව විසින් අනුගමනය කරනු ලැබේ.

3.1.6 (*a*) ස්ථිර ඉගැන්වීම් කාර්ය මණ්ඩලයේ විශේෂ දැනුම සහිත පුද්ගලයන් සිටින නමුත් එම දැනුමම අවශ්‍ය කරන වෙනත් පීඨයක එබඳු ආචාර්යවරුන් නොමැති විට බාහිර පදනම මත එබඳු වෙනත් පීඨයක් එම දේශන පැවැත්වීමට එම දේශකවරුන්ට අවසර දී තිබේ.

(*b*) (i) තාවකාලික කථිකාචාර්ය, නිබන්ධක, ප්‍රදර්ශක ආදී තනතුරුවලට සියලු බඳවා ගැනීම් සිදු කර ඇත්තේ නියම මාර්ගයෙන් සහ හරියාකාර බඳවා ගැනීමේ පරිපාටි අනුගමනය කිරීමෙන්ය. පුරප්පාඩු වන තනතුරු පිළිබඳ දැන්වීම් හැම අධ්‍යයන වර්ෂයක් පාසාම ප්‍රසිද්ධියට පත් කරන අතර ඒ අනුව කෙනෙකුගේ සේවය අවුරුද්දකට අඩු කාලයක් සඳහා ඉල්ලා ඇත්නම්, එබඳු අයගේ සේවය දීර්ඝ කිරීම පීඨයේ පීඨාධිපතිගෙන් සහ අංශ ප්‍රධානියාගෙන් ද කරුණු විමසා උපකුලපතිවරයා විසින් සිදු කරනු ලැබේ. විශේෂ අවස්ථාවලදී, සමාන හෝ වැඩි සුදුසුකම් සහිත පුද්ගලයෙකු නැත්තාවූ ද, ඔහු අංශයේ අවශ්‍යතාවන් සඳහා ඒකාන්තයෙන් ම අවශ්‍ය වන්නා වූ ද අවස්ථාවලදී අවුරුද්දකට වැඩි කාලයක් සඳහා සේවය දීර්ඝ කිරීම් අනුමත කරනු ලබන්නේ විශ්වවිද්‍යාල පාලක සභාව විසිනි.

(ii) අයදුම්පත් කැඳවා දැන්වීමක් පළ කළ විට ලැබුණු ඉල්ලුම් පත්‍ර අතර වඩා ඉහළ සුදුසුකම් සහිත අපේක්ෂකයන් නොසිටි බැවින් ද, අභ්‍යන්තර වැඩ පිළිවෙලවල් යෙදීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩල නොසිටි බැවින් ද අංශයේ අධ්‍යයන කටයුතු බාධාවකින් තොරව සිදුකර ගෙන යාම සඳහා තාවකාලික/කොන්ත්‍රාත්/පැවරුම් පදනම මත සිටි කාර්ය මණ්ඩලය රඳවා ගැනීම අත්‍යවශ්‍ය විය.

(iii) ප්‍රවීණ අධ්‍යයන වෘත්තීය පුද්ගලයකුගේ සේවය කෙටි කාලයක් සඳහා ලබා ගත හැකි හැම විටකම, අංශ ප්‍රධානියාගේ සහ පීඨාධිපතිගේ ඉල්ලීම මත අංශයේත් ශිෂ්‍යයන්ගේත් යහපත තකා එම පුද්ගලයන් පත් කර ගනු ලැබේ.

(*c*) ඉහත (6) යටතේ දක්වා ඇති අවස්ථාවලදී හැර සෙසු සියලුම පත්වීම් සිදු කර ඇත්තේ නිසි බඳවා ගැනීමේ පරිපාටි අනුගමනය කිරීමෙනි.

(*d*) මේ දෙදෙනාම රජයේ චක්‍රලේඛ ප්‍රකාර නැවත සේවයේ පිහිටුවන ලදුව ඔවුන් සේවයට නොපැමිණි කාලය අංක 11/1993 හා 1993.06.04 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 13 හා 1995.07.14 දින දරන චක්‍රලේඛය ප්‍රකාර හිලවු කරන ලදී.

3.1.8 (*b*) විභාග දිනයේ සිට මාස තුනක් ඇතුළත ප්‍රතිඵල මුදාහැරීමට හැකි වන පරිදි අදාළ ලකුණු අප්‍රමාද ව විභාග ශාඛාව වෙත එවන ලෙස පරීක්ෂකවරුන්ට උපදෙස් දීමට උපකුලපතිවරයා පියවර ගෙන තිබේ.

3.1.9 (i) විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ආචාර්යවරුන්ට/නිලධාරීන්ට පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා පඩිරහිත/පඩිසහිත අධ්‍යයන නිවාඩු, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 88 සහ 1980 ජූලි 10 වැනි දින දරන චක්‍රලේඛයේ සඳහන් නියමයන් සහ කොන්දේසි ප්‍රකාර අනුමත කරනු ලැබේ. මෙම චක්‍රලේඛය යටතේ කථිකාචාර්යවරුන්ට අවුරුද්දකට වැඩියෙන් නිවාඩු අනුමත කරනු ලැබේ.

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එහි අංක 88 දරන චක්‍රලේඛය අංක 429 හා 1990 මාර්තු 02 දින දරන චක්‍රලේඛනයෙන් අවලංගු කොට අධ්‍යයන නිවාඩු අනුමත කෙරෙන කාලය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පාලක සභාවට සිය අභිමතය පාවිච්චි කිරීමට බලය පවරා තිබේ.

3.1.10 මෙම වෙනස්වීම්වලට හේතු වී ඇත්තේ අලුත් දීමනා ඉදිරිපත් කිරීම, වැටුප් ප්‍රතිශෝධනය කිරීම්, දුරකථන ගාස්තු වැඩිකිරීම් ආදිය වන අතර මේවා අපේ පාලනයෙන් පරිබාහිර වූ දේවල්ය.

4.0 වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රබල පද්ධති සහ පාලන ක්‍රම අනුගමනය කිරීමට හැම ප්‍රයත්නයක් ම දරනු ලැබේ. දැනටමත් පහත සඳහන් පියවරවල් ගෙන තිබේ.

(අ) *භාණ්ඩ ලබා ගැනීම සහ ඉන්වෙන්ටරි පාලනය* :

*භාණ්ඩ ලබා ගැනීම,* මිලදී ගැනීම් සම්බන්ධයෙන් දැඩි ක්‍රමයක් අනුගමනය කරනු ලැබේ. අනුගමනය කෙරෙන ක්‍රියා පරිපාටි මෙසේය

(i) වටිනාකම රු. 200,000 ඉක්මවන භාණ්ඩ අනුමත කරන්නේ මිලදී ගැනීමේ කමිටුවයි.

(ii) භාණ්ඩවල වටිනාකම මත මිල ගණන් කැඳවීමේ/ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කෙරේ.

(iii) අවශ්‍ය අවස්ථාවන්හි දී තාක්ෂණික ඇගැයීම් කමිටුවේ වාර්තාව ලබා ගැනේ.

(iv) පාවිච්චි කරන අංශයේ නිලධාරියකු, සැපයුම් අංශයේ නිලධාරියකු සහ අභ්‍යන්තර විගණන නිලධාරියකු ඇතුළත් කණ්ඩායමක් විසින් ගුණාත්මක තත්ත්වය සහතික කරනු ලැබේ.

(v) ඉන්වෙන්ටරි රෙජිස්ටරයේ භාණ්ඩ ඇතුළත් කරන අතර මුදල් ගෙවීමට පෙර GRN ඇති කරනු ලැබේ.

ඉන්වෙන්ටරි පාලනය :

(i) ලැබීම් සහ නිකුත් කිරීම් පරිගණක ගත කර තිබේ.

(ii) මාසික භාණ්ඩ විශ්ලේෂණ මගින් වියදම් ගිණුම් ගත කරනු ලැබේ.

(iii) ගබඩා අත්තිකාරම් ගිණුම (සැපයුම්) සහ ගබඩා අත්තිකාරම් ගිණුම (නඩත්තු) යනුවෙන් වෙන වෙනම ගබඩා අත්තිකාරම් ගිණුම් දෙකක් ප්‍රධාන ලෙජරයේ පවත්වා ගෙන යනු ලැබේ.

(v) අතිරේක ගබඩා ලෙජර් ගිණුම්, ප්‍රධාන ලෙජර් ගිණුම් සමඟ සසඳනු ලැබේ.

(vi) පීඨ අනුව වියදම් සමීක්ෂණය කරනු ලැබේ.

(vii) තොග ශේෂය සහ එක් එක් භාණ්ඩයේ වටිනාකම ඕනෑම අවස්ථාවක ලබා ගත හැකිය.

*ණය ගැතියෝ* :

ලැබිය යුතුව තිබෙන සියලුම සැපයුම් සහ අත්තිකාරම් සමීක්ෂණය කොට ත්‍රෛමාසික වාර්තාවක් මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

*අයවැය පාලනය :*

අයවැය පාලනය සම්බන්ධයෙන් පහත සඳහන් පියවරවල් ගෙන තිබේ.

(i) මුදල් කමිටුව සහ පාලක සභාව විසින් වාර්ෂිකව අයවැය ලේඛනය අනුමත කරනු ලැබේ.

(ii) වෙන් කළ මුදල් ප්‍රමාණය ඇතුළත වියදම් කෙරෙන බවට සමීක්ෂණය කරනු වස් වැය ලෙජරය පරිගණක ගත කරනු ලැබේ.

(iii) මාසික සංසන්දනාත්මක ප්‍රකාශය (අයවැය ගත මුදල - සැබෑ වියදම) මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

(iv) චවුනියා පරිශ්‍රයට දී ඇති උප අක් මුදල, විශ්ව විද්‍යාලයේ මුදල් ශාඛාවේ තබා ඇති වෙනම වැය ලෙජරයක් මගින් සමීක්ෂණය කරනු ලැබේ.

*විගණන මතය* :

යාපනය විශ්වවිද්‍යාලයේ 2004 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(1) හා 111 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මාගේ උපරිම තොරතුරු සහ මට සපයන ලද පැහැදිලි කිරීම් අනුව, මාගේ වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගත වන ගැලපීම් හේතුවෙන් ඇතිවන බලපෑම් හැර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට සහ මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා ඇති ගණකාධිකරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත්, එමගින් 2004 දෙසැම්බර් 31 දිනට විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වයෙහි සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල සහ මූල්‍ය ප්‍රවාහයෙහි සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බවත් මාගේ මතය වේ.

විගණනයේදී උද්ගත වූ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් විශ්වවිද්‍යාලයේ උපකුලපති අමතන ලද සමදින දරන මාගේ වාර්තාවේ ඇතුළත්ව ඇත.

ඩබ්ලිව්. ඩී. හේමරත්න,
වැඩබලන විගණකාධිපති,

2005 අප්‍රේල් මස 29 දින,
කොළඹ 07, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ දී ය.

11-620

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය

2007.09.27 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ගයා ලලනි ද අල්විස් විසින් සහතික කරන ලද 1999.03.22 දිනැති අංක 721 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2007.07.31 දින තෙක් පොලිය වශයෙන් රුපියල් දාසය ලක්ෂ අසූනව දහස් පන්සිය අනූ එකක (රු. 16,89,591) මුදලක් සමඟ රුපියල් දාසය ලක්ෂ අසූ නව දහස් පන්සිය අනූඑකක (රු. 16,89,591) මුදලක් මත වසරකට සියයට දාහතර (14%) බැගින් පොලියක්, 2007.08.01 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පන්නිපිටිය, නියදගල, අංක 112හි පදිංචි නිමල් විතානාරච්චි මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 721 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් දාසය ලක්ෂ අසූනව දහස් පන්සිය අනූ එකක (රු. 16,89,591) මුදල සමඟ 2007.08.01 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### විකිණීමට ඇති දේපළ

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, හෝමාගම සහ නියදගල හි පිහිටි ගලවිලවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වී. ඒ. ජේ. සේනාරත්න විසින් සාදන ලද 1963.08.13 දිනැති අංක 2718 දරන පිඹුරේ විස්තර කළ ලොට් 81 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : එම ඉඩමේ කොටසක්ද ; නැගෙනහිරට: පාරද ; දකුණට: පාර සඳහා වෙන් කළ ලොට් N ද ; බස්නාහිරට : ලොට් 82 ද, මායිම්ව පර්චස් විස්සයි දශම පහක (අ. 0, රූ 0, පර්. 20.5) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G-982/110 හි ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කළ ලොට් 81 වශයෙන් සඳහන් එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද 1996 අගෝස්තු 05 දිනැති අංක 1124 දරන මෑත මිණුම් පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලයේ, පල්ලේපත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවේ, හෝමාගම හි පිහිටි ගලවිලවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද 1996 අගෝස්තු 05 දිනැති අංක 1124 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : උපාලි ගෲප් දේපළ (ගලවිලවත්ත) ද ; නැගෙනහිරට : විදර්ශන මාවත ද ; දකුණට : 1 වන පටුමග ; බස්නාහිරට :අංක 2718 දරන පිඹුරේ ලොට් 82 ද, මායිම්ව පර්චස් දහඅටයි දශම හතක (අ. 0, රූ. 0, පර්. 18.7) බිම් ප්‍රමාණය සමඟ එහි පිහිටි ගහකොළ, වැවිලි ගොඩනැගිලි සහ සියලු දේ වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. එන්. පී. සුරවීමල,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධි ශ්‍රේණි ශාඛාව,
බම්බලපිටිය.

11-603

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය

නුගේගොඩ සුභද්‍රාරාම පාර, අංක 103හි කාර්යාලය සහ කඳාන, නාගොඩ මොරවත්ත, මෝල පාර, අංක 17 හි කර්මාන්ත ශාලාව පිහිටි සීමාසහිත කිංස් ඇපරල් (පුද්ගලික) සමාගමේ ණය වගකීම් සඳහා උකස් කළ දේපළ - බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 2001 ජනවාරි 27 දිනැති අංක 17273 ඒ දරන පිඹුරේ විස්තර කළ නාගොඩ, මෝල පාර, වරිපනම් අංක 17 දරන 'ගොලුමඩමවත්ත' නැමති ඉඩමේ ලොට් අංක 2 සහ 3.

2007.09.27 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. 1.1 පහසුකම් 1 - මහජන නොතාරිස් ධම්මික කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2006.04.25 දිනැති අංක 1628 දරන උකස් බැඳුම්කරය මත කාලීන ණය ඇ. ඩො. 155,000ක් මත මුල් මුදල හා 2007.08.27 වෙනි දින තෙක් පොලිය වශයෙන් ඇමෙරිකානු ඩොලර් එක්ලක්ෂ තිස්අට දහස් අටසිය අනූහයයි දශම හතරයි තුනක (ඇ. ඩො. 138,896.430) මුදලක් සමඟ ඇමෙරිකානු ඩොලර් එක්ලක්ෂ තිස්එක් දහස් හත්සිය අසූවක (ඇ. ඩො. 131,780) මුදලක් මත වසරකට තුන්මසක ලයිබෝ + 3.0% අනුපාතය බැගින් පොලියක් 2007.08.28 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් නුගේගොඩ, සුභද්‍රාරාම පාර, අංක 103හි පදිංචි සීමාසහිත කිංස් ඇපරල් (පුද්ගලික) සමාගමෙන් අයවිය යුතුව ඇත.

1.2 පහසුකම 2 - මහජන නොතාරිස් ධම්මික කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2005.09.30 දිනැති අංක 1621 සහ මහජන නොතාරිස් කේ. කේ. පී. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද 2004.10.19 දිනැති අංක 373 දරන උකස් බැඳුම්කර මත කාලීන ණය ඇ. ඩො. 295,000ක් මත මුල් මුදල හා 2007.08.27 දින තෙක් පොලිය වශයෙන් ඇමෙරිකානු ඩොලර් දෙලක්ෂ පනස් එක් දහස් පන්සිය හයයි දශම බිංදුවයි අටක (ඇ. ඩො. 251,506.08) මුදලක් සමඟ ඇමෙරිකානු ඩොලර් දෙලක්ෂ හතලිස් දහස් අටසිය අසූවක (ඇ. ඩො. 240,880) ක මුදලක් මත වසරකට තුන්මසක ලයිබෝ + 3.0% අනුපාතය බැගින් පොලියක් 2007.08.28 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් නුගේගොඩ, සුභද්‍රාරාම පාර, අංක 103හි පිහිටි සීමාසහිත කිංස් ඇපරල් (පුද්ගලික) සමාගමෙන් අයවිය යුතුව ඇත.

2. එකී 1628 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී ඇමෙරිකානු ඩොලර් එක්ලක්ෂ තිස්අට දහස් අටසිය අනූහයයි දශම හතරයි තුනක (ඇ. ඩො. 138,896.43) මුදල සමඟ 2007.08.28 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, එකී අංක 373 සහ 1621 දරන බැඳුම්කර මත අයවිය යුතු ඇමෙරිකානු ඩොලර් දෙලක්ෂ පනස් එක් දහස් පන්සිය හයයි දශම බිංදුවයි අටක (ඇ. ඩො. 251,506.08) මුදල සමඟ 2007.08.28 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව් හි පදිංචි වෙන්දේසිකාර ආර්. එස්. එම්. වෙන්දේසිකාර මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පල කිරීමට ලංකා බැංකුවේ සම්බන්ධතා කළමනාකරුටද, (අයකිරීම් ශාඛා/ආයතනික) මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### ඉහත සඳහන් උපලේඛනය

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලයේ, රාගම්පත්තුවේ, ජා-ඇල, ප්‍රාදේශීය සභා සීමාවේ කොට්ඨාශ අංක 3 හි නාගොඩ, මෝල පාර, වරිපනම් අංක 17 දරන "ගොලුමඩමවත්ත " නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 2001 ජනවාරි 27 දිනැති අංක 17273ඒ දරන පිඹුරේ විස්තර කළ ලොට් 2 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : එකී අංක 17273ඒ දරන පිඹුරේ ලොට් 1 ද ; නැගෙනහිරට : එකී අංක 17273 ඒ දරන පිඹුරේ ලොට් 3 ද ; දකුණට : ජෝශප් රණසිංහ සහ යූ. ජී. පෙරේරා යන අයගේ ඉඩමද :; බස්නාහිරට : එමලියානු සමරනායකගේ ඉඩමද, මායිම්ව එකී අංක 17273ඒ දරන පිඹුර අනුව රූඩ් දෙකයි, පර්චස් විස්සක් (අ.0, රූ. 02. පර්. 20) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි පහයි දෙකයි නවයක් (හෙක්. 0.2529) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමඟ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ සියලු දේ වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 527/22හි ලියාපදිංචි කර ඇත.

එකී නාගොඩ හි මෝල පාර, වරිපනම් අංක 17 දරන "ගොලුමඩමවත්ත" නැමැති ඉඩමේ එකී අංක 17273ඒ දරන පිඹුරේ විස්තර කළ ලොට් 3 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : එකී අංක 17273ඒ දරන පිඹුරේ ලොට් 1 (වෙන් කළ පාර) ද ; නැගෙනහිරට : මොරවත්ත පාර ද ; දකුණට : ජෝශප් රණසිංහගේ පාර ද ; බස්නාහිරට : එකී අංක 17273ඒ දරන පිඹුරේ ලොට් 2 ද, මායිම්ව, එකී අංක 17273ඒ දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් පහයි දශම පහයි බිංදුවක (අ. 0, රූ. 1, පර්. 5.50) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම එකයි එකයි පහයි එකක (හෙක්. 0.1151) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමඟ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ සියලු දේ වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 549/12හි ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

එකී නාගොඩ හි පිහිටි "ගොලුමඩමවත්ත" නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1997 ජනවාරි 05 දිනැති අංක 15273 දරන පිඹුරේ විස්තර කළ ලොට් "සී " වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට: මෝල පාරද ; නැගෙනහිරට : මොරවත්ත පාරද ; දකුණට : ගොලුමඩමවත්තේ ඉතිරි කොටසද ; බස්නාහිරට ඊ. සමරනායකගේ පාරද, මායිම්ව එකී අංක 15273ඒ දරන පිඹුර අනුව පර්චස් එකොලහයි දශම අටක (අ. 0, රූ. 0, පර්. 11.8) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 357/204හි ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කළ ලොට් "සී " වශයෙන් සඳහන් එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 2001 ජනවාරි 27 දිනැති අංක 17273ඒ දරන මෑත මිණුම් පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

එකී නාගොඩ හි පිහිටි "ගොලුමඩමවත්ත " නැමැති ඉඩමේ එකී අංක 17273 ඒ දරන පිඹුරේ විස්තර කළ ලොට් 1 වශයෙන් සඳහන් බෙදන ලද්දා වූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : මෝල පාරද : නැගෙනහිරට : මොරවත්ත පාරද ; දකුණට : ලොට් 3 සහ 2ද ; බස්නාහිරට : ලොට් 2 සහ එමලියානු සමරනායකගේ ඉඩමද, මායිම්ව එකී අංක 17273ඒ දරන පිඹුර අනුව පර්චස් එකොලහයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 11.80) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි නවයයි අටක (හෙක්. 0.0298) ප්‍රමාණයෙන් යුක්ත වේ.

තවද, මීළඟ ගන්නා සහ ඔහුට පෙර සිටි තැනැත්තන් විසින් අවුරුදු 50කට වඩා හිමිකම් පෑ, 2001 ජනවාරි 27 දිනැති අංක 17273ඒ, 1997 ජනවාරි 05 දිනැති අංක 15273, 1979 ජූලි 20 දිනැති අංක 5084, 1942 ජූලි 15 දිනැති අංක 37 දරන පිඹුරුවල පෙන්වා ඇති මෝල පාර මත පයින් සහ වාහනයේ ගමන් කිරීමට, පාවිච්චි කිරීමේ අයිතිය සමඟ අදාල සියලු අයිතීන්ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩී. ආර්. එල්. පෙරේරා,
සම්බන්ධතා කළමනාකරු.

2007 ඔක්තෝබර් මස 04.
ලංකා බැංකුව,
අයකර ගැනීම් ශාඛා/ආයතනික ඒකකය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

11-602

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය: 01/0/00/3154

ණයකරුගේ සම්පූර්ණ නම: ජස්ටින් විජේසිරි ගුණවර්ධන

පිළියන්දල ප්‍රසිද්ධ නොතාරිස් ටී. ජී. එස්. ඒ. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 487 හා 1994.11.08 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හතලිස් තුන්දහස් තුන්සිය හතලිස් හතයි ශත තිස් එකක (රු. 43,347.31) මුදලක් වර්ෂ 2004.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තිස්හයදහස් නවසිය තිස් නවයයි ශත අනූහයක (රු. 36,939.96) මුදල ද වර්ෂ 2004.06.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හයදහස් හාරසිය හතයි ශත තිස් පහක් (රු. 6,407.35) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හතළිස් තුන්දහස් තුන්සිය හතළිස් හතයි ශත තිස් එකක් (රු. 43,347.31) ද,

(2) එකී රුපියල් තිස්හයදහස් නවසිය තිස් නවයයි ශත අනූහයක (රු. 36,939.96) මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.50% බැගින් වන පොළියක් 2004.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම් කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2004ක් වූ ජූලි මස 29 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේපත්තුවේ තලගල ග්‍රාමයේ හි පිහිටි ඔලබොඩුව වතුයාය නැමැති ඉඩමට 1994.04.06 දින ඩී. කපුගීකියන මානක තැන විසින් මැන සම්පාදිත අංක 3955 පිඹුර ප්‍රකාර ලොට් 26 ට මායිම් උතුරට : කැබලි අංක 17 සහ 18 ද ; නැගෙනහිරට : කැබලි 25 ද ; දකුණට : කැබලි අංක ආර්. අඩි 20ක් පළල පාර ද ; බටහිරට : කැබලි අංක 27ද, යන මායිම් තුල පිහිටි පර්චස් පහළොවක් (අක්. 0, රූ. 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද, මාර්ග පරවශතාවය ද සමඟ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 107/300හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

11-597

---

LE/RE/201

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය: 0100007500

ණයකරුගේ සම්පූර්ණ නම: විතානගේ චම්පිකා ලක්මාලි පෙරේරා සහ මද්දගේ ප්‍රදීප් සුසන්ත.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩබ්ලිව්. අබේසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 2965 හා 2006.03.08 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරණ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්, එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් නවලක්ෂ තුන්දහස් නමසිය පනස්නවයයි ශත අසූහතරක (රු. 903,959.84) මුදලක් වර්ෂ 2007.05.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හත්ලක්ෂ අනූඅටදහස් හත්සිය අනූඑකයි ශත තිස්අටක (රු. 798,791.38) මුදල ද වර්ෂ 2007.05.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් එක්ලක්ෂ පන්දහස් එකසිය හැටඅටයි ශත හතලිස්හයක් (රු. 105,168.46) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් නවලක්ෂ තුන්දහස් නවසිය පනස්නවයයි ශත අසූහතරක් (රු. 903,959.84) ද,

(2) එකී රුපියල් හත්ලක්ෂ අනූඅටදහස් හත්සිය අනූඑකයි ශත තිස්අටක (රු. 7,98,791.38) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.90% බැගින් වන පොළියක් 2007.06.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දනර බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ ජූලි මස 23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාවේ, (නාරන්වල උප කාර්යාල සීමාවේ) නාරන්වල ග්‍රාමයෙහි පිහිටි මිල්ලගහවත්ත නැමැති ඉඩමට 2003.03.16 දින කේ. එච්. එම්. බී. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 1128 පිඹුර ප්‍රකාර ලොට් 5ට මායිම්, උතුරට : ඒ. කේ. චන්ද්‍රදාස යන අයට අයත් ඉඩමද ; නැගෙනහිරට : ලොට් 6ද ; දකුණට : ප්‍රාදේශීය සභා පාර ද ; බටහිරට : ලොට් 2 සහ 4 ද, යන මායිම් තුල පිහිටි පර්චස් විසි තුනයි දශම නවයක (අක්. 0, රූඩ්. 0, පර්. 23.9) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේ ද, මාර්ග පරවශතාවය ද සමඟ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 665/33හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරි.

11-598

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්. සී.

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂවරුන් අතරේ බෙදාහැරීමෙන් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාර නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.09.14 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

" කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ආර්. රණසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 4116 සහ 2004 නොවැම්බර් මස 25 දින සහ අංක 4337 සහ 2005 මැයි මස 09 දින දරන උකස් බැඳුම්කර මත මොරටුව විල්ලෝරාවත්ත ශ්‍රී දීපානන්ද පාරේ අංක 204 දරන ස්ථානයේ "සිතුම් ලී බඩු නිෂ්පාදකයෝ " යන නාමය, අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරුවකු වශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන මොරටුව, විල්ලෝරාවත්ත ශ්‍රී දීපානන්ද පාරේ අංක 204 දරන ස්ථානයේ පදිංචි තේවර තන්ත්‍රිගේ චාන්දනී ප්‍රසාදිකා ප්‍රනාන්දු (මෙහි මින් මතු උකස් තබන්නා වශයෙන් සඳහන් කරනු ලබන) මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය එකී තේවර තන්ත්‍රිගේ චාන්දනී ප්‍රසාදිකා ප්‍රනාන්දු විසින් කොළඹ 02 යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි (කලින් කොළඹ 01 යෝර්ක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි) මෙහි මින්මතු "බැංකුව " වශයෙන් හඳුන්වනු ලබන නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී (කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) නමට උකසට තබා, ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් තබා ඇති බැවින් ද,

තව ද එකී බැඳුම්කර මත ලබා දෙන ලද පහසුකම් මත අයවිය යුතු ගෙවීම් පැහැර හැර ඇති බැවින් එකී බැඳුම්කර මත ලබා දෙන ලද පහසුකම් මත රුපියල් දශ ලක්ෂ අසූහත් දහස් තුන්සිය හැත්තෑ අටයි ශත හතරක (රුපියල් 10,87,378.04) මුදලක් වර්තමානයේ දී 2007.08.09 දින වන විට නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙතට ලැබිය යුතු සහ අයවිය යුතු බැවින් ද,

ඉහත කී රුපියල් දස ලක්ෂ අසූහත් දහස් තුන්සිය හැත්තෑ අටයි ශත හතරක (රුපියල් 10,87,378.04) මුදල සහ කාලීන ණය 1 මත 2007.08.10 දිනට අයවිය යුතු මුල් මුදල වන රුපියල් තුන් ලක්ෂ හතලිස් අටදහස් නවසිය හතලිස් හතරකුත් ශත අනූවක් (රුපියල් 3,84,944.90) මුදල සඳහා 2007.08.10 දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට තිහයි දශම පහයි හතරක (30.54%) පොලිය ද සහ කාලීන ණය 2 මත 2007.08.10 දිනට අය විය යුතු මුල් මුදල වන රුපියල් හයලක්ෂ තිස් අට දහස් තුන්සිය අසූ හතරකුත් ශත හැත්තෑ එකක් (රුපියල් 6,38,384.71) මුදල සඳහා 2007.08.10 දින සිට වර්ෂයකට සියයට විසි අටයි දශම පහයි හතරක (28.54%) පොලිය ද ඒ හා සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එවක් පටන් ගෙවන ලද (යම් මුදලක් වේ නම්) එයද අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක සහ සේනානායක ඕක්ෂනියර්ස් හි ත්‍රිවංක සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.".

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාව තුළ විල්ලෝරාවත්තේ පිහිටි දීපානන්ද පාරේ, වරිපනම් අංක 28/38 දරන තුනිරවල්ල කුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. එන්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 2239 සහ 1996 මාර්තු 12 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 1 ලෙස ලකුණු කරන ලද බෙදා වෙන් කළ ඉඩමට මායිම් : උතුරට: තුනිරවල්ල කුඹුර ද, පී. එස්. පී. ප්‍රනාන්දුගේ සහ පී. ජේ. පී. ප්‍රනාන්දුගේ අංක 2148 දරන පිඹුරේ ලොට් 1හි ඉතිරි කොටස ද, නැගෙනහිරට: අඩි 5ක් පළල අගල ද, දකුණට: විල්ලෝරාවත්තට යන නගර සභා පාර ද, බස්නාහිරට: තුනිරවල්ල කුඹුර ද, පී. එස්. සී. ප්‍රනාන්දු සහ පී. ජේ. පී. ප්‍රනාන්දුගේ අංක 214B දරන පිඹුරේ ලොට් අංක 1 සහ 2 හි ඉතිරි කොටස ද,

යන මායිම් තුළ පිහිටි පර්චස් තිහකුත් දශම හතයි පහක (අ.0, රූ. 0, පර්. 30.75) හෝ හෙක්ටයාර් 0.778ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, පස්, ගහකොළ, පළතුරු ආදී සියළු දේත් සමග වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2852/71 දරන පත් ඉරුවේ/වෙළුමේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

11-493/3

---

## මහජන බැංකුව– කුරුණෑගල අධිශ්‍රේණිය ශාඛාව

### වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වන යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.06.22 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

"කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් වයි. පී. කේ. තෙන්නකෝන් මහත්මිය විසින් සහතික කරන ලද 2002.09.17 දිනැති අංක 2762, 2006.03.13 දිනැති අංක 4860, 2006.03.13 දිනැති අංක 4861, 2003.07.16 දිනැති අංක 3307 හා දරන උකස්කරය ප්‍රකාර ගනේගොඩගේ අජිත් ප්‍රේමචන්ද්‍ර මහතා සහ ඉදිරිසිංහ පතිරණලාගේ අයිරාංගනී චන්ද්‍රලතා යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරයන් යටතේ පිළිවෙලින් රුපියල් හැට එක් දහස් හයසිය පනස් එකයි ශත තිහක (රු. 61,651.30) මුදලක් ද, රුපියල් හාර ලක්ෂ දහසය දහස් හයසිය හැට හයයි ශත හැත්තෑවක් (4,16,666.70) රුපියල් ලක්ෂ පහක් (රු. 5,00,000) හා රුපියල් දෙලක්ෂ පනස් දහසක් (රු. 2,50,000) ද. දැනට මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, පිළිවෙලින් 2007.02.25 දින සිට වර්ෂයකට සියයට විසි හතර (24%) බැගින් රුපියල් හැට එක් දහස් හයසිය පනස් එකයි ශත තිහක් (රු. 61,651.30) මුදලක් සඳහා ද, 2007.02.16 දින සිට වර්ෂයකට සියයට විස්සයි දශම පහ (20.5%) බැගින් රුපියල් හාර ලක්ෂ දහසය දහස් හයසිය හැට හයයි ශත හැත්තෑවක් (රු. 4,16,666.70) සඳහා ද, 2006.12.01 දින වර්ෂයකට සියයට විසි එකයි දශම පහ (21.5%) බැගින් රුපියල් ලක්ෂ පහක (රු. 5,00,000) මුදලක් සඳහා ද, 2006.12.01 දින සිට වර්ෂයකට සියයට විසි එක (21%) බැගින් රුපියල් දෙලක්ෂ පනස් දහසක (රු. 2,50,000) මුදලක් සඳහා ද, වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර පිළිවෙලින් එකී රුපියල් හැට එක් දහස් හයසිය පනස් එකයි ශත තිහක් (රු. 61,651.30) ද, රුපියල් හාර ලක්ෂ දහසය දහස් හයසිය හැටහයයි ශත හැත්තෑවක් (රු. 4,16,666.70) රුපියල් ලක්ෂ පහක (රු. 5,00,000) සහ රුපියල් දෙලක්ෂ පනස් දහසක් (රු. 2,50,000) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ඩබ්. එම්.

අයි. ගල්ලැල්ල මහතා විසින් එකී අංක 2762, 4860, 4861 හා 3307 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ 29 ඩී (29D) වගන්තිය යටතේ ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.".

### උකස්කර ඇති දේපල පිළිබඳ විස්තර

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඩාගල්බඩ කෝරළේ, වැඩවිල්ලි හත්පත්තුවේ, අස්වැද්දුම ගමෙහි පිහිටි අස්වැද්දුමවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර මහතා විසින් මැන සකස් කරන ලද අංක 234/85 සහ 1985.10.20 දින දරන පිඹුර ප්‍රකාර ලොට් 2 දරන ඒකාබද්ධ ඉඩමට මායිම් උතුරු-නැගෙනහිරට : කැබලි අංක 13 දරන අඩි 15ක් පළල පාර, උතුරු-බස්නාහිරට : කැබලි අංක 06, දකුණු-නැගෙනහිරට : අඩි 20 පළල පාර, දකුණු-බස්නාහිරට : කැබලි අංක 01. යන මෙකී මායිම් තුල වූ, පර්චස් විස්සක් (පර්. 20) විශාල ඉඩම සහ ඊට අයත් ගසකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සැම සියලු දේ සමඟ ද වේ.

(එම් පී 91/278 - කුරුණෑගල)
(ඒ 1492/223 - කුරුණෑගල)
(ඒ 1492/06 - කුරුණෑගල)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 210, වැහැර,
කුරුණෑගල.

11-558

---

## මහජන බැංකුව– කුරුණෑගල

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වන යොජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.07.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

"කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් වයි. පී. කේ. තෙන්නකෝන් මහත්මිය විසින් සහතික කරන ලද 2005.11.16 දිනැති අංක 4631 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් ජයකොඩි ආරච්චිලාගේ ගාමිණී විජේසූරිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද එකී උකස්කරය යටතේ රුපියල් පන්ලක්ෂ අනූ හත් දහස් අටසියයයි ශත හතරක් (රු. 5,97,800.04) මුදලක් දැනට මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2007.04.17 දින සිට වර්ෂයකට සියයට දහසයයි දශම හතයි පහ (16.75%) බැගින් රුපියල් පන්ලක්ෂ අනූ හත් දහස් අටසියයයි ශත හතරක් (රු. 5,97,800.04) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනතේ 29ඩී (29 D) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද, සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් පන් ලක්ෂ අනූ හත් දහස් අටසියයයි ශත හතරක (රු. 5,97,800.04) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලැල්ල මහතා විසින් එකී අංක 4631 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ 29ඩී (29 D) වගන්තිය යටතේ ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.".

### උකස්කර ඇති දේපල පිළිබඳ විස්තර

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩවිල්ලි හත් පත්තුවේ, තිරගන්දහය කෝරළේ, පල්ලේ කුඹල්පොල ගමේ පිහිටි "හෙරලියාවල වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර මහතා විසින් මැන සාදන ලද අංක 167/ඒ 88 සහ 89.03.23 කියා ඇතත් වඩාත් නිවැරදි ලෙස 1989.03.22 දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 168 දරන ඉඩමට මායිම්: උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : ලොට් අංක 169 ද, දකුණට : ලොට් අංක 163 දරන අඩි 20 පළල ප්‍රවේශ මාර්ගය ද, බස්නාහිරට : ලොට් අංක 167 ද, යන මෙකී මායිම් තුල වූ පර්චස් පහළොවක් (අක්. 0, රූ.0, පර්. 15ක් විශාල) ඉඩම සහ ඊට අයත් ගසකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සැම සියලු දේ සමඟ ද වේ.

(ඒ 1191/281-කුරුණෑගල).

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 210, කොළඹ පාර,
වැහැර,
කුරුණෑගල.

11-557

---

## මහජන බැංකුව– මහර ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.10.20 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

"ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 1999.02.11 දිනැති අංක 3809 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, අම්බලන්ගොඩගේ චන්ද්‍ර ආනන්ද කුරේ යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් පන්ලක්ෂ හැටඅටදහස් පනස්හතයි ශත පනහක (රු. 5,68,057.50) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින්ද, 2000.05.23 දින සිට වර්ෂයකට 18% බැගින් රුපියල් පන්ලක්ෂ හැටඅටදහස් පනස්හතයි ශත පනහක (රු. 5,68,057.50) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන

බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පන්ලක්ෂ හැටඅටදහස් පනස්හතයි ශත පනහ (රු. 5,68,057.50)ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 3809 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් අතරින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2004.05.10 දිනැති අංක 9201 දරන නිදහස් කිරීමේ ඔප්පුවෙන් නිදහස් කරන ලද කොටස් අත්හැරි පසු ඉතිරි කොටස් වන මෙහි පහත විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර දලුපිටිය ගමෙහි පිහිටි මිල්ලගහවත්ත නැමැති ඉඩමට බලය ලත් මිනින්දෝරු ඩී. ඒ. කටුගම්පොල විසින් 1996.08.16 වන දින මැන සාදන ලද අංක 80/1996 දරන පිඹුරේ ලොට් අංක "AY" දරන කොටසට මායිම්, උතුරු-නැගෙනහිරට: ලොට් "AX" ද, දකුණු-නැගෙනහිරට: පාරද, දකුණු-බස්නාහිරට: පිඹුරු අංක 80/1996හි ලොට්"AYZ"ද, උතුරු-බස්නාහිරට: පිඹුරු අංක 75/1995 හි ලොට් "A5 " ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් දහයයි දශම තුනයි අට (අ. 0, රූ. 1, පර්. 10.38)ක විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදි සියළු දේත් වේ.

මෙම ඉඩම පහත ඉඩමෙන් බෙදා වෙන් කල කොටසකි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර දලුපිටිය ගමෙහි පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඒ. කටුගම්පොල විසින් 1996.08.16 වන දින මැන සාදන ලද අංක 80/1996 දරන පිඹුරේ ලොට් අංක "AY" දරන කොටසට මායිම් උතුරු-නැගෙනහිරට: ලොට් "AX" ද, දකුණු-නැගෙනහිරට: පාර ද, දකුණු-බස්නාහිරට: පිඹුරු අංක 75/1995හි ලොට් A3 ද, උතුරු-බස්නාහිරට: පිඹුරු අංක 75/1995හි ලොට් A 5 ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් විස්සයි දශම තුනයි අට (අ. 0, රූ. 1, පර්. 20.38) ක විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදි සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 441/198හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
කලාපීය කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

11-556

### නේෂන් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂවරුන් විසින් අතරේ බෙදා හැරීමෙන් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නේෂන් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.10.17 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. සුබසිංහ විසින් සහතික කරන ලද අංක 2273 සහ 2005 මැයි මස 27 දින දරන උකස් බැඳුම්කරය මගින් වත්තේගම යටිරාවන අංක 151 දරන ස්ථානයේ පදිංචි සමරකෝන් අතුකෝරලගේ ජයනෙත් කුමාරසිංහ යන අය විසින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රයන් ඔහු විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි (කලින් කොළඹ 01, යෝක් වීදියේ, අංක 76 දරන ස්ථානයේ පිහිටි) මෙහි මින් මතු "බැංකුව" වශයෙන් සඳහන් කරනු ලබන නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමට (කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) උකසට තබා ඇති බැවින් ද,

තව ද, එකී සමරකෝන් අතුකෝරලගේ ජයනෙත් කුමාරසිංහ එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද පහසුකම් මත අය විය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද පහසුකම මත 2007.08.15 වන දිනට රුපියල් අට ලක්ෂ හයදහස් එකසියයකුත් ශත දහ අටක (රුපියල් 8,06,100.18) මුදලක් එකී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව පවතින බැවින් ද,

එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී රුපියල් අට ලක්ෂ හයදහස් එකසියයකුත් ශත දහඅටක (රු. 8,06,100.18) මුදල සහ 2007.08.15 දිනට අයිරා පහසුකම් මත මුල් මුදල වශයෙන් රුපියල් හත්ලක්ෂ අනූ තුන්දහස් හැට තුනයි ශත පනස් දෙකක (රුපියල් 7,93,063.52) මුදල මත 2007.08.16 වන දින සිට විකිණීමේ දිනය තෙක් මාසික විරාමයන් සමග වැල්පොළී පදනමක් මත වර්ෂයකට 40%ක් බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අය කිරීම්, ප්‍රචාරක වියදම් වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම් ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) ඒ මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ගාමිණී බී. එස්. දියව මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ යටිරාවන වටපුළුවේ ගහවට කෝරළේ වර්තමානයේ මහනුවර මහ නගර සභා සීමාව තුළ පිහිටි පිටකන්ද වත්ත නමැති ඉඩමට මහනුවර බලයලත් මිනින්දෝරු සී. සමරනායක විසින් මැන සාදන ලද 1990 මැයි මස 30 වන දින සහ අංක 52 දරන පිඹුරේ ලොට් 3 B වශයෙන් ලකුණු කොට නිරූපිත බෙදා වෙන් කරන ලද එකී අංක 52 දරන පිඹුරේ එකී ලොට් 3 Bට මායිම්, උතුරට : මහනගර සභා පාර ද, නැගෙනහිරට : ෆිනෑන්ස් කොම්පැණිය විසින් කොටස් කරන ලද ඉඩම ද, දකුණට : ලොට් 3A දරන එම ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : ලොට් 3A දරන එම ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක (අ. 0, රූ. 0,

පර්. 20.0) විශාලත්වයෙන් යුක්ත ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ සෑම සියලු දේත් සමග වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 367/79 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජ සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

11-493/1

---

මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 593/105 හි ලේඛනගතව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු (මාතර).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 38/1ඒ,
පිට්ටනිය පාර,
මාතර.

11-552

---

## මහජන බැංකුව - මාතර ධර්මපාල මාවත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඩී" වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඩී" වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.06.22 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

මාතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. රණසිංහ විසින් සහතික කරන ලද 2004.05.18 දිනැති 6045 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, බුලත්සිංහලගේ ජගත් නන්ද කුරේ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර අංක 6045 යටතේ රුපියල් තුන් ලක්ෂ තිස්හතර දහස් තුන්සිය හැත්තෑපහයි ශත තිස් එකක (රු. 3,34,375.31) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2006.03.02 දින සිට වර්ෂයකට සියයට දහසය(16%) බැගින් රුපියල් තුන් ලක්ෂ තිස්හතරදහස් තුන්සිය හැත්තෑපහයි ශත තිස් එකක (රු. 3,34,375.31) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාළ මහජන බැංකු පනතේ 29 "එල්" වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව රුපියල් තුන් ලක්ෂ තිස්හතර දහස් තුන්සිය හැත්තෑ පහයි ශත තිස් එකක (රු. 3,34,375.31) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 6045 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපල පිළිබඳ විස්තර

01. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ තලල්ල පිහිටි කොරදමනියවත්ත අංක 01 ට 1993.10.31 දිනැති එන්. විජේවීර බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 4708 දරන පිඹුරෙන් බෙදූ ඒකාබද්ධ කැබලි අංක 18 සහ 19 ට එම පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : මෙම ඉඩමේ අංක 15 දරන කැබැල්ල ද, නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 40 දරන පාර ද, දකුණට : මෙම ඉඩමේ අංක 22 දරන කැබැල්ල ද, බස්නාහිරට : මෙම ඉඩමේ අංක 14 සහ 24 දරන කැබලි ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිහක් (අක්. 0, රූ. 0, පර්. 30) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි වැව්ලි ගොඩනැගිලි යනාදී සියළු දෑය ද වේ.

---

## මහජන බැංකුව - ගාල්ල මහ වීදිය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.06.22 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් මහගමගේ චූලාංගනී අරෝෂිනී විසින් සහතික කරන ලද 2005.07.27 දිනැති අංක 469 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, හික්කඩුව ගමගේ සුනීතා සහ මතික්කුවාදුර කරුණාදාස යන අයවලුන් විසින් පැහැරහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක්ලක්ෂ අනූදහසකුත් ශත එක (රු.190,000.01) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2005.12.08 දින සිට වර්ෂයකට 16.75% බැගින් රුපියල් එක්ලක්ෂ අනූදහසකුත් ශත එක (රු.190,000.01) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද, සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ අනූදහසකුත් ශත එක (රු.190,000.01) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 469 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතුයැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපල පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ (දකුණ) ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයට අයිති මලිද්දුව නමැති ගමෙහි මොන්රෝවියා වත්ත යනුවෙන් නිරූපිත ඉඩමට සර්වේ ජනරාල්වරයා විසින් සාදන ලද ඔහු භාරයේ ඇති අංක 2080 සැලැස්මෙහි අංක 83 දරන බිම් කැබැල්ලට මායිම්, උතුරට: මෙම පිඹුරේ කැබලි අංක 72 ද, නැගෙනහිරට : මෙම පිඹුරේ කැබලි අංක 82 ද, දකුණට: මෙම පිඹුරේ කැබලි අංක 93 ද, බස්නාහිරට: මෙම පිඹුරේ කැබලි අංක 29 යන සතර මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් විසි හතරක් (අ. 0, රූ. 1, පර්. 24) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ,

පළතුරු යනාදී සියලු දේ ද වේ. මෙම ඉඩම් කැබැල්ල සී 627/3 යටතේ ගාල්ල ඉඩම් කාර්යාලයේ ලේඛනගත වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22,
පහළ ඩික්සන් පාර,
ගාල්ල.

11-554

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂවරුන් අතරේ බෙදා හැරීමෙන් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.09.14 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ආර්. රණසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 4628 සහ 2005 සැප්තැම්බර් මස 02 දින දරන උකස් බැඳුම්කරය මත, මීගමුව, ග්‍රීන්ස් පාරේ, අංක 11 දරන ස්ථානයේ රිමනෝස් සිල්ක්ස් යන නාමය විධානය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන කොච්චිකඩේ, පෝරුතොට, අංක 291 දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් මුනාෆ්වර්, අබ්දුල් වාහීඩ් උම්මු සලීමා සහ මොහොමඩ් සකරියා යන අය විසින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි (කලින් කොළඹ 01, යෝර්ක් වීදියේ, අංක 76 දරන ස්ථානයේ පිහිටි) මෙහි මින් මතු "බැංකුව" වශයෙන් සඳහන් කරනු ලබන නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමට (කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) උකසට තබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයට තබා ඇති බැවින් ද,

තවද එකී මොහොමඩ් මුනාෆ්වර්, අබ්දුල් වාහිඩ් උම්මු සලීමා සහ මොහොමඩ් සකරියා එකී බැඳුම්කරය මත ලබාගන්නා ලද මූල්‍ය පහසුකම මත අයවිය යුතු ගෙවීම පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත ලබාගන්නා ලද මූල්‍ය පහසුකම මත 2007.07.29 වන දිනට රුපියල් දශ ලක්ෂ අනූහත් දහස් එකසිය හැත්තෑ තුනයි ශත හතක (රුපියල් 10,97,173.07) මුදලක් එකී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව පවතින බැවින් ද, එකී බැඳුම්කරය මත ඉහත කී රුපියල් දශ ලක්ෂ අනූහත් දහස් එකසිය හැත්තෑ තුනයි ශත හතක (රුපියල් 10,97,173.07) මුදල සහ කාලීන ණය මත 2007.07.29 වන දිනට අයවිය යුතු මුල් මුදල වන රුපියල් නවලක්ෂ අනූනව දහස් නවසිය විස්සක (රුපියල් 9,99,920.00) මුදල මත 2007.07.30 දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 30.36% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වේනම්) ඒ මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය කොළඹ ගාමිණී, බී. එස්. දියාව මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහනගර සභා සීමාව ඇතුළත ග්‍රෑන්ඩ් වීදියේ අංක 10 නාගරික කොට්ඨාසයේ පිහිටි ග්‍රීන්ස් පාරේ වරිපනම් අංක 11 දරන හන්දිය වත්ත ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. සී. එස්. ගුණරත්න විසින් මැන සාදන ලද අංක 786 සහ 1941 දෙසැම්බර් මස 06 දින දරන පිඹුරේ ලොට් 3 සහ 4A ලෙස ලකුණු කොට එක් ඉඩමක් ලෙස කැබලි දෙකකින් නිරූපිත එකී ලොට් 3 සහ 4A ට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 2 ද, නැගෙනහිරට : ජී. එන්. ද සිල්වා සහ ජී. එස්. ද සිල්වා ගේ දේපළ වෙන් කරන තාප්පය ද, දකුණට : මෙම ඉඩමේ ලොට් 4 ද, බස්නාහිරට: ග්‍රීන්ස් පාර ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 786 දරන පිඹුරට අනුව පර්චස් එකයි දශම දෙකයි හතරක (අ. 0, රූ. 0, පර්. 1.24) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, පස්, ගහකොළ, පලතුරු සහ ඊට අයිති සියලු දේත් සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A253/64 දරන පත්ඉරුවේ/වෙළුමේ ලියාපදිංචි කර ඇත.

අංක 786 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 3 සහ 4A මැත කාලීන මැනුමට අනුව පහත සඳහන් පරිදිය –

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහනගර සභා සීමාව ඇතුළත ග්‍රෑන්ඩ් වීදියේ අංක 10 දරන නාගරික කොට්ඨාසයේ පිහිටි ග්‍රීන්ස් පාරේ වරිපනම් අංක 11 දරන හන්දියවත්ත ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් මැන සාදන ලද අංක 1589/1 සහ 1989 අප්‍රේල් 01 දින දරන පිඹුරේ ලොට් 3 සහ ලොට් 4A ලෙස ලකුණු කොට එක් ඉඩමක් ලෙස කැබලි දෙකකින් නිරූපිත එකී ලොට් 3 සහ 4A ට මායිම්, උතුරට : කුමා සුදසිංහගේ ඉඩම ද, නැගෙනහිරට : ඒ. එල්. සේදිරිස් සිල්වාගේ ඉඩම ද, දකුණට : ජෙන්නතුල් ෆාහිරාගේ ඉඩම ද, බටහිරට : ග්‍රීන්ස් පාර ද යන මායිම් තුළ පිහිටි එකී 1589/1 පිඹුර අනුව පර්චස් එකයි දශම දෙකයි හතරක( අ. 0, රූ. 0, පර්. 1.24) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, පස්, ගහකොළ, පලතුරු සහ සියලුදේත් සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A253/64 පත් ඉරුවේ/වෙළුමේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

11-493/2

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අතරේ බෙදා හැරීමෙන් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම**

පහත දැක්වෙන යෝජනා සම්මතය නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007.10.23 වන දින ඒකමතිකව අනුමත කරන ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. එෆ්. විජේසූරිය විසින් සහතික කරන ලද 1987 පෙබරවාරි 19 දිනැති අංක 287 දරන උකස්කරයෙන් ද, සියල්ලම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් දයේන්ද්‍ර සමරසිංහ විසින් සහතික කරන ලද 1991 අප්‍රේල් 02 දිනැති අංක 1533 දරන උකස්කරයෙන් ද, 1995 ජනවාරි 25 දිනැති අංක 2041 දරන උකස්කරයෙන්ද, 1997 මාර්තු

මස 05 දිනැති අංක 2260 දරන උකස්කරයෙන්ද, 1992 ජනවාරි 08 දිනැති අංක 1650 දරන උකස්කරයෙන්ද, 1992 අප්‍රේල් 27 දිනැති අංක 1685 දරන උකස්කරයෙන්ද, 1995 ජනවාරි 25 දිනැති අංක 2043 දරන උකස්කරයෙන්ද, 2001 ජනවාරි 19 දිනැති අංක 2655 දරන උකස්කරයෙන්ද, 1992 ජූනි 03 දිනැති අංක 1696 දරන උකස්කරයෙන්ද, 1993 ඔක්තෝබර් 15 දිනැති අංක 1914 දරන උකස්කරයෙන් ද, 1995 ජනවාරි 25 දිනැති අංක 2045 දරන උකස්කරයෙන්ද, 1997 මාර්තු 05 දිනැති අංක 2262 දරන උකස්කරයෙන්ද, 2001 ජනවාරි 19 දිනැති අංක 2657 දරන උකස්කරයෙන්ද, නුගේගොඩ එස්. ද එස් ජයසිංහ මාවතේ අංක 27 දරන ස්ථානයේ යූනිවර්සල් වර්ක්ස් (ටෙක්ස්ටයිල්ස්) පොජෙක්ස් යන නාමය විධානය සහ අභිධානය යටතේ ඒක පුද්ගල ව්‍යාපාරය පවත්වාගෙන යන විදානගමච්චිගේ නලීන් ශානක රණවීර උපලේඛනයන්හි වඩාත් විස්තර කරුණු ලබන දේපළවල අයිතීන්, දේපල සහ පරිශ්‍රයින් ඔහු විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොළඹ 02, යූනියන් පෙදෙස අංක 242 හි කලින්(කොළඹ 01, යෝර්ක් වීදියේ අංක 76 හි) පිහිටි (මින් පසු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී වෙත උකස් කරන ලද හෙයින් ද,

එකී බැඳුම්කරය මත සුරක්ෂිත කරන ලද මූල්‍ය පහසුකම් ගෙවීමට එකී විදාන ගමච්චිගේ නලීන් ශානක රණවීර පැහැර හරින ලදුව වර්ෂ 2007 සැප්තැම්බර් මස 09 වන දින වන විට නේෂන්ස් ට්‍රස්ට් බැංක් පී.එල්.සී වෙත එකී බැඳුම්කර මත සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන තුනකුත් අටලක්ෂ හතලිස් පන්දහස් හත්සිය හැත්තෑ හතයි ශත අනූවක (රු.3,845,777.90) මුදලක් සහ එක්සත් ජනපද ඩොලර් එකසිය අනූ හතරදහස් හත්සිය විසි හයයි ශත හැත්තෑපහක ($ 194,726.75) මුදලක් දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින්ද,

එකී උපලේඛනයන්හි වඩාත් විස්තර කරුණු ලබන දේපළවල අයිතීන්, දේපල සහ පරිශ්‍රයන් එකී බැඳුම්කරයන් මගින් ඇප ලෙස තැන්පත් කරමින් ලබාගත් පහසුකම් මත අයවිය යුතු මුළු මුදල වන රුපියල් මිලියන තුනකුත් අටලක්ෂ හතලිස් පන්දහස් හත්සිය හැත්තෑ හතයි ශත අනූවක (රු. 3,845,777.90) මුදල සහ එක්සත් ජනපද ඩොලර් එකසිය අනූ හතරදහස් හත්සිය විසි හයයි ශත හැත්තෑපහක ($ 194,726.75) මුදල සහ 2007.09.10 දින සිට විකිණීමේ දිනය දක්වා කාලීන ණය පහසුකම් මත 2007.09.09 දිනට හිඟ හිටුවා ඇති මුල් මුදල වන රුපියල් මිලියන දෙකයි තුන්සිය හතර දහස් තුන්සිය අනූ පහයි ශත හැත්තෑ හතරක (රු. 2,304,395.74) ක මුදල් මත වාර්ෂිකව සියයට විස්සක (20%) ක පොලියක්ද, කාලීන ණය පහසුකම් මස 2007.09.09 දිනට හිඟ හිටුවා ඇති මුල් මුදල වන එක්සත් ජනපද ඩොලර් විසිනවදහස් නවසිය තිස් හතයි ශත හතලිස් නවයක් ($ 29,937.49) ක මුදල් මත වාර්ෂිකව සියයට නවයයි දශම එකයි හතක (9.17%) ක පොලියක්ද, කාලීණ ණය පහසුකම මත 2007.09.09 දින හිඟ හිටුවා ඇති මුල් මුදල වන එක්සත් ජනපද ඩොලර් පහලොස් දහස් හත්සිය පනහක (US $ 15,750) ක මුදල් මත වාර්ෂිකව සියයට අටයි දශම හතක (8.7%) ක පොලියක්ද, බැංකු අයිරා පහසුකම් මත 2007.09.09 දිනට හිඟ හිටුවා ඇති මුල් මුදල වන රුපියල් හාරදහස් නවසිය අසූ දෙකයි ශත තිස් දෙකක (රු.4,982.32) මුදල් මත වැල් පොලී පදනම මත වාර්ෂිකව සියයට හතලිහක (40%) ක පොලියක්ද, බැංකු අයිරා පහසුකම් මත 2007.09.09 දිනට හිඟ හිටුවා ඇති මුල් මුදල වන රුපියල් හයදහස් දෙසිය විසි පහයි ශත අටක (රු. 6,225.08) මුදල මත වැල් පොලී පදනම මත වාර්ෂිකව සියයට හතලියක (40%) ක පොලියක් ද, මාසික විරාමයන් සමග අනුගාමී ගාස්තු ද, ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වැය කරන්නට සිදුවූ වෙනත් මුදල් ප්‍රමාණයන්ද, පහසුකම් ලබාගත් දින සිට ගෙවා ඇති (කිසියම් මුදලක් වේ නම්) ඒ මුදල අඩුකොට අයකර ගැනීම සඳහා කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක වෙන්දේසිකරුවන්ගේ ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය ද කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

(1) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සහ සීමාව තුළ කුරුදුවත්තේ කලින් වෝඩ් පෙදෙසෙහි වරිපනම් අංක 24/5 දැන් සුබස්ථාන් ගාඩ්න්ස් හි වරිපනම් අංක 12 දරන බලයලත් මිනින්දෝරු එච්. දොන් ඩේවිඩ් විසින් මැන සාදන ලද අංක 2050 හා 1935 පෙබරවාරි 22 දිනය දරන පිඹුරේ ලොට් අංක 06 වශයෙන් ලකුණු කරන ලද 'ගුඩ්වුඩ්' නැමැති බෙදා බෙන් කල ඉඩම් කැබැල්ලට මායිම් උතුරට : එකී අංක 2050 දරන සැලැස්මේ ලොට් අංක 7 දරන බිම් කැබැල්ල ද, නැගෙනහිරට : වොඩ් පෙදෙසේ වරිපනම් අංක 30 ටිල්ටන්ගේ පරිශ්‍රයද, දකුණට : රොස්මින් පෙදෙසේ වරිපනම් අංක 41 දරන 'ශ්‍රී වියල්ස්' හි පරිශ්‍රය ද සහ බස්නාහිරට : කැබලි අංක 5 සහ අඩි 20 ක් පළලැති පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි විශාලත්වයෙන් අංක 2050 දරන එකී සැලැස්මේ ප්‍රකාර පර්චස් තිස්හතරයි සියයෙන් අනූපහක් (අ.0, රූ.0, පර්.34/95/100) වූ ඉඩම මෙය කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 375/281 යටතේ ලියාපදිංචි කරන ලදී. සහ සෑම අවස්ථාවකම පයින් හෝ වෙනත් අන්දමින් දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ සදහටම යාම් ඊම් කිරීමේ අවසරය සහ බලයද අශ්වයින් හරකුන් හෝ වෙනත් සත්වයින් සමග හෝ නැතිව ගෙන යාමේ අයිතියද මෝටර් රථ ලොරි බඩු පටවාගෙන හෝ බඩු රහිතව එකී මාර්ගයේ එහා මෙහා ගමන් කිරීමේ අයිතිය ද කැලිකසළ කානු සහ ජලනල සවිකිරීම ද, ඉඩම් තුලින් විදුලි බලය සඳහා උඩින් වයර් ඇදීමද කැලි කසළ බැස්සවීම සඳහා නල සවිකිරීමටද සහ වෙනත් අවශ්‍ය දේ සවි කිරීමටද අවසර ඇති. ඉහත කී කුරුදු වත්තේ වෝඩ් පෙදෙසෙහි පිහිටි අංක 2050 දරන එකී සැලැස්මෙහි දක්වා ඇති (අඩි 20 ක් පළලැති පාරක් සඳහා වෙන් කරන ලද බිම් තීරය) බෙදා වෙන් කල බිම් කැබැල්ලට මායිම් උතුරට : වෝඩ් පෙදෙස ද, නැගෙනහිරට : වෝඩ් පෙදෙසේ වරිපනම් අංක 26 හි 'විලා ෆිරෙන්ස්'පරිශ්‍රය සහ එකී 2050 පිඹුරේ ලොට් අංක 07 සහ 06ද, දකුණට : එකී අංක 2050 දරන සැලැස්මේ කැබැලි අංක 5 සහ 4 ද, බස්නාහිරට : එකී අංක 2050 දරන පිඹුරේ ලොට් 1, 2 සහ 3 වන යන එකී මායිම් තුළ පිහිටි එකී අංක 2050 දරන සැලැස්ම ප්‍රකාරව බිම් ප්‍රමාණය පර්චස් 32 යි සියයෙන් තිස්හයක් (අ. 0, රූ. 0 පර්. 32.36/100) සහ කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ375/282 යටතේ ලියාපදිංචි කරන ලදී.

(2) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (දැනට ගල්කිස්ස ලියාපදිංචි කොට්ඨාසය තුල) සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභා සීමාව තුළ පිටකෝට්ටේ පිහිටි පාගොඩ පාරේ වරිපනම් අංක 139 සහ 139ඒ දරන කොට්ටනුවේවත්ත යන ටී. ඞී. ඩබ්. පී. පෙරේරා බලයලත් මිනින්දෝරු විසින් සාදන ලද 1987 ජූනි මස 28 වන දිනැති අංක 718 දරන සැලැස්මේ ලොට් අංක 1 ලෙස ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද එකී අංක 1 දරන බිම් කැබැල්ලට මායිම්, උතුරට : පාගොඩ පාරේ වරිපනම් අංක 143/3 සහ 143/4 ද, නැගෙනහිරට : පාගොඩ පාරේ වරිපනම් අංක 141, දකුණට : පාගොඩ පාරද සහ බස්නාහිරට : පොදු අඩි පාරද සහ බිම් කාණුවද වන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම විශාලත්වයෙන් අංක 718 සැලැස්ම ප්‍රකාර බිම් ප්‍රමාණය රූඩ් එකයි පර්චස් විසිහයයි දශම නමයයි බින්දුවක් (අ. 0, රූ. 1, පර්. 26.90) වන ඉඩම් කොටස මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1746/238 යටතේ ලියාපදිංචි කරන ලදී.

(3) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගර සභා සීමාව තුළ වැල්ලවත්තේ දැනට ඩබ්ලිව්. ඒ. සිල්වා මාවතේ පිහිටි මීට පෙර පාමංකඩ පාරේ පසු කලෙක මහවීදිය යයි කියන ලද කලින් වරිපනම් අංක 434, 435 සහ 436 දරන වශයෙන් ද, පසුකලෙක අංක 62, 64 සහ 66 වශයෙන් ද දැන් අංක 62 දරන එකී බිම් කැබැල්ල සහ එහි තිබෙන්නා වූ ගොඩනැගිලි සහ සියලු දේ වේ.

I. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගර සභා සීමාව තුළ වැල්ලවත්ත ඩබ්ලිව්.ඒ.සිල්වා මාවතේ පිහිටි අංක 02 දරන ලියාපදිංචි පිඹුරේ ලොට් 205 දරන ඉඩමට මායිම්, උතුරට : පාරද, නැගෙනහිරට: ලොට් අංක 204, දකුණට : 206 සහ බස්නාහිරට : ලොට් අංක 205 ඒ යන මෙකී මායිම් තුළ බිම් ප්‍රමාණයෙන් 1891 අප්‍රේල් 07 දිනැති ලියාපදිංචි පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් දහයයි සියයෙන් හැටක පංගුවක් වේ (අ. 0, රූ. 1, පර්. 10 60/100) වේ . මෙම ඉඩම කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වැල්ලවත්ත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 101/166 ලියාපදිංචි කරන ලදී.

II. ඉහත කී වැල්ලවත්තේ ඩබ්ලිව්. ඒ. ද සිල්වා මාවතේ අංක 2 දරන ලියාපදිංචි පිඹුරේ ලොට් අංක 204 බිම් කැබැල්ලට මායිම්, උතුරට : පාරක් ද නැගෙනහිරට : ලොට් අංක 201ද, දකුණට : ලොට් අංක 206 සහ බස්නාහිරට : ලොට් අංක 205 දරන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි සීයෙන් විසිපහක් (අ. 1, රූ, 0,

පර්. 8.25/100) වේ. මෙය කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව වැල්ලවත්ත 131/186 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජ සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

11-494

---

## මහජන බැංකුව - තල්ගස්වල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 200.10.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. දුල්මිණී සුනාරි විසින් සහතික කරන ලද 2003.07.07 දිනැති අංක 683 දරන උකස් ප්‍රකාර ගෙවීම.

වැලිකඩ ගමගේ ගාමිණී දේශාන්ත යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් තුන් ලක්ෂ පනස් නම දහස් නමසිය අසූඅටයි ශත විසිතුනක (රු.3,59,988.23) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2005.08.24 දින සිට වර්ෂයකට සියයට දහනමයක් (19%) බැගින් රුපියල් තුන් ලක්ෂ පනස් නම දහස් නමසිය අසූඅටයි ශත විසිතුනක (රු. 3,59,988.23) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29ඕ (29එල්) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන් ලක්ෂ පනස් නම දහස් නමසිය අසූඅටයි ශත විසිතුනක (රු.3,59,988.23) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 683 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපල පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, අම්බන පිහිටි ගුලනේ කන්ද ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර මහතා විසින් 2003.02.04 දින මැන සම්පාදිත අංක 193/2003 දරන පිඹුර ප්‍රකාර අංක 1 සහ 2 දරන ඒකාබද්ධ කැබලි දෙක සඳහා මායිම් උතුරට: පීපී 9638 හි ලොට් 2843 සහ ගම්වැසියන්ට අයිති ඉඩම ද ; නැගෙනහිරට: ගුලනේ කුඹුර ද; දකුණට: මෙම ඉඩමේම ලොට් 3 සහ 9 ; බස්නාහිරට: ගුලනේ කන්දද, වන අක්කර හයයි පර්චස් තිස් හතක් (අක්කර 6, රූඩ් 0, පර්චස් 37) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ පලතුරු ආදී සියලු දේද වේ.

මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 471/170 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී අම්බන පිහිටි ගුලනෙ කන්ද ඉඩමට බලයලත් මිනින්දොරු කේ. කන්නන්ගර මහතා විසින් නැවත බෙදා වෙන්කොට 2003 පෙබරවාරි 04 දින මැන සම්පාදිත අංක 193/2003 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 3 දරන කැබැල්ලට මායිම්, උතුරට මෙම ඉඩමේ ලොට් අංක 2ද, නැගෙනහිරට පොත් ගුලට යන පාරද, දකුණට මෙම ඉඩමේම ලොට් 04 සහ බස්නාහිරට ගුලනෙ කන්ද යන සතර මායිම් තුල පිහිටි පර්චස් තිස්හතක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 37) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි ගහකොල පලතුරු ඇතුළු සියළු දේද වේ.

මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 478/30 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී අම්බන පිහිටි ගුලනෙ කන්ද ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර මහතා විසින් 2003 පෙබරවාරි 04 දින මැන සම්පාදිත අංක 193/2003 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 4,5,6 සහ 7 දරන ඒකාබද්ධ කැබලි සඳහා මායිම්, උතුරට මෙම ඉඩමේ ලොට් අංක 3 ද, නැගෙනහිරට මෙම ඉඩමේ ලොට් 9 ද, දකුණට මෙම ඉඩමේම ලොට් 08 ද, බස්නාහිරට ගුලනෙ කන්ද මායිම් වන අක්කර දෙකයි, රූඩ් එකයි, පර්චස් එකක් (අක්. 2, රූ. 1, පර්. 1) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි ගහකොල පලතුරු ඇතුළු සියළු දේද වේ.

මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී478/30 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී අම්බන පිහිටි ගුලනෙ කන්ද ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර මහතා විසින් නැවත බෙදා වෙන්කොට 2003.02.04 දින මැන සම්පාදිත අංක 193/2003 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 08 දරන කැබැල්ල සඳහා මායිම් උතුරට: මෙම ඉඩමේ ලොට් අංක 07 ද, නැගෙනහිරට: මෙම ඉඩමේ ලොට් අංක 09, දකුණට හා බස්නාහිරට: පන්සලට අයිති ඉඩමද, යන සතර මායිම් තුල පිහිටි පර්චස් තිස්හතක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 37) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොල පලතුරු ආදී සියලු දේද වේ.

මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 478/32 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර, ගාල්ල.

11-555

---

## මහජන බැංකුව - හික්කඩුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.07.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් සහතික කරන ලද 2005.10.13 දිනැති අංක 149 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්.

සුරේන්ද්‍රාචාරි වසන්ත, තලේසිංහගේ ශ්‍රියාණි ප්‍රේමකුසුම් සහ ගංචාරි මැගිලින් යන අයවලුන් විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් නමලක්ෂ හැත්තෑහය දහස (රු.9,76,000) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද, 2006.10.28 දින සිට වර්ෂයකට 19.5% බැගින් රුපියල් නමලක්ෂ හැත්තෑපන්දහස (රු. 9,75.000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් නමලක්ෂ හැත්තෑහය දහස (රු. 9,76,000) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 149 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, හික්කඩුවේ වැවල පිහිටි බෙලිගහවත්ත *නොහොත්* ගොඩඋඩවත්ත *නොහොත්* අද්දරවත්ත නමැති ඉඩමේ අංක 13 දරන කැබැල්ලට මායිම් උතුරට: මෙම ඉඩමේ කැබලි අංක 12 ද, නැගෙනහිරට: බෝගස්පිට්ටනියවත්ත, ගොරකගහවත්ත සහ ගල්පොත්තෙවත්ත ද, දකුණට: මෙම ඉඩමේ කැබලි අංක 14 ද, බස්නාහිරට මෙම ඉඩමේ කැබලි අංක 31 (අඩි පාර ) ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිස්හයයි දශම දෙකයි පහ (අක්කර 0, රූඩ් 0, පර්චස් 36.25)ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි ඇතුළු සියළු දේද වේ. මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 452/142 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී ඉඩම මෑතකදී කරන ලද මැනුම් ප්‍රකාර පහත සඳහන් පරිදි විස්තර වේ.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, හික්කඩුවේ වැවල පිහිටි බෙලිගහවත්ත *නොහොත්* ගොඩඋඩවත්ත *නොහොත්* අද්දරවත්ත නමැති ඉඩමට බලයලත් මානක එන්. සී. විජේවික්‍රම මහතා විසින් මැන සම්පාදිත අංක 1809 සහ 2005.05.03 දින දරන පිඹුර ප්‍රකාර අංක 13 දරන කැබැල්ලට මායිම් උතුරට: මෙම ඉඩමේ කැබලි අංක 12 ද, නැගෙනහිරට: බෝගස්පිට්ටනියෙවත්ත, ගොරකගහවත්ත සහ ගල්පොත්තෙවත්ත ද, දකුණට: මෙම ඉඩමේ කැබලි අංක 14 ද, බස්නාහිරට: පාර ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිස් එකයි දශම අටයි නමය (අක්කර 0, රූඩ් 0, පර්චස් 31.89) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි ඇතුළු සියළු දේ ද වේ.

සුසිලාචාර මාවතේ සිට මාර්ග පරවශ්‍යතා අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22
පහල ඩික්සන් පාර,
ගාල්ල.

11-553

---

## සෙලාන් බැංකුව පීඑල්සී - රත්නපුර ශාඛාව

### 2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 ජුලි මස 09 වන දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0070-01410397-101

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. අබේරත්න විසින් සහතික කරන ලද 2004 නොවැම්බර් 23 දිනැති අංක 3516 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අයගම පදිංචි හිරිලියද්ද විදානෙලාගේ ලලිත් ඔස්මන් අමරසූරිය යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ පන්දහස් එකසිය හැට හයයි ශත පහළොවක (රු. 4,05,166.15) මුදලක්, 2007 පෙබරවාරි 28 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 4,05,166.15 මුදල ද, 2007 මාර්තු 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 3516 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

